ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2026.01.05 |

ඩබ්ලිව්.ඒ.එච්.බුද්ධික
270/එෆ්, තැඹිලිගස්මුල්ල පාර,
කිරිබත්ගොඩ

*පැමිණිලිකාර පාර්ශවය*

ඩබ්ලිව්.ඒ. සෙතුනි හෙසනායා
11 ශ්‍රේණිය
යශෝධරා විද්‍යාලය
කොළඹ 08

*වින්දිත පාර්ශවය*

එදිරිව

*පැමිණිලි අංකය- එච්.ආර්.සී. 1603-25*

1. තුෂාන් නෙරංජන මයා
   පන්තිභාර ගුරු
   යශෝධරා විද්‍යාලය, කොළඹ 08

2. සුලාරි ජයවර්ධන
   බාලදක්ෂිකා නායිකාව
   යශෝධරා විද්‍යාලය, කොළඹ 08

3. නිලූකා සමන්කුමාරි මිය
   විදුහල්පති
   යශෝධරා විද්‍යාලය, කොළඹ 08

4. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
   කලාප අධ්‍යාපන කාර්යාලය
   කොළඹ

*වගඋත්තරකාර පාර්ශවය*




| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04.<br>இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04.<br>No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011- 2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011- 2505541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrcsl@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011- 2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

## පැමිණිල්ල

පැමිණිලිකරු 2025.05.30 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින්, ඔහුගේ දියණිය වන ඩබ්ලිව්.ඒ.සෙතුනි හෙසන්‍යා කොළඹ යශෝධරා විද්‍යාලයේ 11 ශ්‍රේණියේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලබන බවත්, 2024 සිට පාසලේ බාලදක්ෂ කටයුතු භාර ගුරුවරිය ලෙස කටයුතු කරන සුලාරි උමන්දා ජයවර්ධන මහත්මිය විසින් අඛණ්ඩ මානසික හිරිහැරකිරීම් වලට ලක් කර ඇති බවත්, දියණිය බටහිර තූර්ය වාදක කණ්ඩායම, රතු කුරුස සංගමය, බෞද්ධ සංගමය ඇතුළු පාසල් සංගම් කිහිපයක ක්‍රියාකාරී සාමාජිකාවක්, කනිෂ්ඨ ශිෂ්‍ය නායිකාවක් සහ බාලදක්ෂිකා ජනාධිපති සම්මානය සඳහා සූදානම් වෙමින් සිටින බවත් සඳහන් කර ඇත. තව ද මෙලෙස දිගුකාලීනව සිදුවූ හිරිහැර හේතුවෙන් දෙමාපියන් පෞද්ගලික උපදේශන මනෝවිශ්ලේෂඥයකුගේ සහය ලබාගැනීම සම්බන්ධයෙන් විදුහල්පතිවරිය සහ පන්ති භාර ගුරුවරයා දැනුවත් කර ඇත. දරුවාගේ පෙර කම්පනය තත්වය හේතුවෙන් ශාරීරිකව තරවටු නොකරන ලෙස මනෝඋපදේශක උපදෙස් දුන් බවට පාසල දැනුවත් කර තිබිය දී එය නොතකා 2025 පෙබරවාරි 18 වන දින පන්තිභාර ගුරුවරයා වන තුෂාන් නෙරංජන විසින් දියණියට පන්ති වාර්තා පොතකින් පහර දී ශාරීරිකව දඬුවම් කර ඇති බවයි. මෙම පහරදීමෙන් ඇය දැඩි චිත්තවේගී බිඳවැටීමකට ලක්ව 2025.04.08 දින සිට පාසල් යාම ප්‍රතික්ෂේප කර ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එසේම මෙම පහරදීම සම්බන්ධයෙන් විදුහල්පතිවරිය වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව විදුහල්පතිනිය වසර කිහිපයකට පෙර පාසලේ ගුරුවරියක් වන විද්‍යාරත්න මහත්මියගේ දියණිය සම්බන්ධ මෙවැනි සිදුවීමක් උපුටා දක්වමින් දරුවා පාසලෙන් ඉවත් කර ගන්නා ලෙස දැනුම්දුන් බවයි. දරුවා අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වන බැවින් එම දැනුම්දීම පරිදි දරුවා පාසලෙන් ඉවත් කර ගැනීම දෙමාපියන් ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, විසඳුමක් ලෙස පන්තිභාර ගුරුවරයා උගන්වනු ලබන කාලපරිච්ඡේද තුළ දී දරුවාට උපදේශන කාමරයේ හෝ පුස්තකාලයේ රැඳී සිටින ලෙස විදුහල්පති වැඩිදුරටත් දැනුම් දී ඇත. විදුහල්පති දෙමාපිය රැස්වීමක් කැඳවා දරුවාට සිදුකරන ලද ශාරීරික හා මානසික හිරිහැර සම්බන්ධයෙන් නිවැරදිව හෙළි නොකරමින් අනෙක් දෙමාපියන් පන්තිභාර ගුරුවරයා ඉවත් නොකරන ලෙසට ඉල්ලීම් කළ බවට අවශ්‍ය ලියවිල්ලකට ඔවුන්ගෙන් අත්සන් ලබාගෙන ඇති බවයි. මෙලෙස කිසිදු විසඳුමක් නොලැබීම මත දරුවා නැවත පාසලට පැමිණියද සමහර සිසුන් සහ ගුරුවරුන්ගෙන් ඇයට තවදුරටත් හිරිහැර එල්ල වී ඇත. එලෙස පාසලට නැවත ගිය අවස්ථාවක දී දරුවා බාලදක්ෂිකා කටයුතු සඳහා අවශ්‍ය ලේඛනයක් සඳහා විදුහල්පතිගේ අත්සන ලබාගැනීමට ගිය අවස්ථාවේ දී විදුහල්පිතිනිය දරුවාට නැවත පාසලෙන් අස්ව යන ලෙස දැනුම්දීමෙන් පසු දරුවාගේ තත්වය තවත් නරක අතට හැරුණු බවත් සඳහන් කර ඇත. මෙම චිත්තවේගීය පීඩාව මත පාසල් උපදේශන ගුරුවරයා වැඩිදුරටත් මානසික වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතු බවට නිර්දේශ කර යොමු කරන ලද මනෝ චිකිත්සකවරිය දරුවාට මානසික අවපීඩනය ඇති බව හඳුනාගෙන වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට උපදෙස් දී දැනට ඖෂධ ලබා ගනිමින් සිටින බවයි.

මෙම පැමිණිල්ල මගින් දියණියගේ ආත්ම අභිමානය නැවත ගොඩනැගීම, දියණියගේ මානසික යහපැවැත්ම සහ අඛණ්ඩ අධ්‍යයන ප්‍රගතිය සහතික කිරීම සඳහා මනෝචිකිත්සකගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සහ බාලදක්ෂිකා ජනාධිපති සම්මාන වැඩසටහනට සුලාරි ජයවර්ධන මහත්මිය සමග සම්බන්ධ නොවීමෙන් සම්මානය සම්පූර්ණ කිරීම සඳහා ආරක්ෂිත, අපක්ෂපාතී සහ සහායක පරිසරයක් සහතික කිරීම සහනය ලෙස අපේක්ෂා කර ඇත.

**පැමිණිල්ල සනාථ කිරීමට ඉදිරිපත් කර ඇති ලේඛණ**

1. 2025.02.19 දිනැතිව විදුහල්පති වෙත යොමු කර ඇති ලිපි පිටපත.

2. විදුහල්පති වෙත යොමු කරන ලද වට්ස්ඇප් පණිවිඩ පිටපත.
3. මනෝ උපදේශනය සඳහා වූ මධ්‍යස්ථානයේ මනෝඋපදේශක හා මනෝචිකිත්සකවරයකු විසින් මානසික තත්වය සම්බන්ධයේ ලබා දී ඇති ලිපි පිටපත.
4. මනෝ උපදේශනයට අදාළව ප්‍රතිකාර ගැනීම සම්බන්ධ වෛද්‍ය සටහන් පිටපත්.
5. විදුහල්පති හා බාලදක්ෂ ගුරුවරිය සමඟ සිදුකළ සංවාද ඇතුලත් සංයුක්ත තැටිය.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම -

**01.** පළමු වගඋත්තරකරු තුෂාන් නිරංජන මයා- පන්තිභාර ගුරුවරයා

2025.06.27 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේ දී කරුණු ඉදිරිපත් කරමින්, ඔහු 11 වන ශ්‍රේණියේ පන්ති භාරව සහ පාසලේ ක්‍රිකට් ක්‍රීඩාව භාරව කටයුතු කරන බවත් වින්දිත දියණියට ඔහු පහරදීමක් සිදු නොකල බවත් වාර්තා පොතෙන් තට්ටු කිරීමක් පමණක් සිදු කළ බවත්, දැනට මෙම කාරණය සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන කාර්යාලය මගින් පරීක්ෂණයක් පවත්වන බැවින් ඔහු දැනට කලාප කාර්යාලයට අනුයුක්තව සිටින බව ප්‍රකාශ කර ඇත.

2025.07.07 දිනැති දිවුරුම් ප්‍රකාශය මඟින් වැඩිදුරටත් කරුණු දක්වමින්, ඔහු යශෝධරා විද්‍යාලයේ 11 වන ශ්‍රේණියේ පන්තිභාර ගුරුවරයා වශයෙන් කටයුතු කිරීමේ දී, පන්තියේ සියලුම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සහ අතිරේක ක්‍රියාකාරකම් උදෙසා අවශ්‍ය සියලුම් සහයෝගය ලබාදුන් බවත්, හෙසන්‍යා වීරමන් යන ශිෂ්‍යාව ඔහුගේ පන්තියේ ඉගෙනුම ලැබූ දැරියක් බවත් ඇය ගුරුවරියකගේ දරුවෙකුත් වුවද අනෙක් සියලු ශිෂ්‍යාවන්ට හා සමානව එක සේ සැළකූ බවත් මෙවර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට සිටින බැවින් පාසැල් වැඩ කටයුතු නොකිරීම හේතුවෙන් නැවත එසේ නොකරන මෙන් සෙමින් පොතකින් තට්ටුවක් දැමූ බවත් සඳහන් කර ඇත. තව ද දරුවාගේ දෙමාපියන් පවසන අයුරින් දිගින් දිගටම පහර දී නිල් පැහැවන තුරු පහරදීමක් නොකළ බවයි. එම සිදුවීම පන්තියේ සිටි සියලුම ශිෂ්‍යාවන් හා එම මොහොතේ පන්තියට පැමිණි සිංහල විෂය භාර ගුරුවරයා ඇසින් දුටු සාක්ෂි වන අතර, මෙම සිදුවීමෙන් පසුව දැරිය පාසැල් පැමිණ අතිරේක ක්‍රියාකාරකම් වූ , තූර්ය වාදන කණ්ඩායමේ අභ්‍යාසවල නිරත වූ බවද එසේ දැඩි ප්‍රහාරයක් ලබා නිල්වුවා නම් එලෙස පාසල් පැමිණීමටද හෝ වාදන භාණ්ඩයක් අභ්‍යාස කිරීමට අපොහොසත් වන බව තරයේ ප්‍රකාශ කර ඇත. හෙසන්‍යා දියණියගේ ගැටලු වලදී ඔහු ඇයත් සමඟ සිටි බවත්, ඔහුගේ කාලසටහන් පවා අතපසු කරමින් දරුවා වෙනුවෙන් පෙනී සිට ඇති අතර විදුහල්පතිතුමිය පවා හමු වීමට දරුවා සමග ගිය බවට විදුහල්පතිතුමිය සාක්ෂි දරන බවයි. මෙම සිදුවීම සිදු වූ දින සහ ඉන් පසු දිනයන්හි හෙසන්‍යා දියණිය ඔහු සමඟින් සුපුරුදු ලෙස කතා කළ බවත්, මෙම සුළු සිදුවීම සම්බන්ධව දිගින් දිගටම බලපෑම් ගැටලු මතු කිරීම හේතුවෙන් විදුහල්පතිතුමිය විසින් ඔහුගේ පන්තියේ සියලුම දෙමාපියන් කැඳවා හමුවීමක් පවත්වා සිදුවීම සම්බන්ධයෙන් දෙමාපියන්ගේ අදහස් විමසන ලද බවත්, දෙමාපිය හමුවට සම්බන්ධ වූ සියලු දෙමාපියන් ගුරුවරයෙක් වශයෙන්ම ඔහු දරුවන් සමග ක්‍රියාකරන අන්දමට එකඟ වන බවත්, ගුරුවරයා සම්බන්ධව ගැටලුවක් නොමැති බවත් ගුරු භූමිකාව සඳහා අනවශ්‍ය බලපෑම් නොකරන ලෙසටත් අදහස් පලකොට ලිපියක් විදුහල්පතිතුමියටම භාර දී ඇත. තව ද එම ලිපිය විදුහල්පතිතුමිය සතුව පවතින බවත්, ඔහු විසින් ගුරුවරයෙකු ලෙස සියලුම දරුවන්ගේ අධ්‍යාපන අභිවෘර්ධිය සඳහා කටයුතු කළ අතර පදනමක් නොමැති සහ අසත්‍ය චෝදනා දිගින් දිගටම එල්ල කරමින් සියලු දෙනාගේම කාලය, හෙසන්‍යා දියණියගේ දෙමාපියන් විසින් විනාශ කරන බවත්, ඔහු මෙම චෝදනාව සඳහා නිවැරදිකරු බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**02.** දෙවනි වගඋත්තරකරු නිලූකා සමන්කුමාරි මිය- විදුහල්පති යශෝධරා විද්‍යාලය

2025.06.27 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේ දී කරුණු ඉදිරිපත් කරමින්, 11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන හෙසන්‍යා දියණියට 2025.02.18 දින පන්ති භාර ගුරුතුමා වන

තුෂාන් නිරංජන නැමැති අය පහරදීමක් සිදු කළ බවට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත්, ඒ සම්බන්ධයෙන් පන්ති භාර ගුරුතුමාගෙන් විමසීමේදී ඔහු පන්ති වාර්තා පොතින් තට්ටුවක් කල බව සඳහන් කළ බවත්, අදාළ පන්තියේ දරුවන්ගෙන් ප්‍රකාශ ලබාගත් නමුත් එම ගුරුවරයා පහරදෙන බවට සාක්ෂි නොලැබුණ බැවින් පන්ති භාර ගුරුවරයා මාරු කිරීමට කටයුතු නොකල බව සඳහන් කර ඇත.

එම අවස්ථාවේ දී මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන හා පරීක්ෂණ අධ්‍යක්ෂ විසින් තට්ටුවක් කලා යනුවෙන් සඳහන් කිරීමෙන් එය පහරදීමක් හෝ පහර නොදීමක් වන්නේ ද සහ මෙම කරුණු සම්බන්ධයන් කලාප කාර්යාලය දැනුවත් කර පරීක්ෂණයක් සිදුකිරීම සම්බන්ධයෙන් කරුණු විමසීමෙන් පසු විදුහල්පතිනිය විසින් පහත කරුණු නැවත ඉදිරිපත් කර ඇත.

එය ගුරුවරයා විසින් සිදු කරන ලද අතට තට්ටු කිරීමක් පමණක් වන බවත් ඒ සම්බන්ධයෙන් පන්තියේ දරුවන්ගෙන් ලබාගත් ප්‍රකාශ වලින් ගුරුවරයා පහරදෙන බවට කරුණු අනාවරණය නොවූ බැවින් කලාපයේ නිලධාරීන් දැනුවත් නොකළ බවත්, එක් ළමයෙක් මෙවැනි ප්‍රකාශයක් සිදු කළ පමණින් පන්ති භාර ගුරුවරයා මාරු කිරීමට නොහැකි බවත් ඔහුට විරුද්ධව වෙනත් කිසිදු සාක්ෂියක් නොමැති බවයි. මෙම දරුවාගේ මව පාසැලේ ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරියක් වන බැවින් විශේෂ සැලකීම් බලාපොරොත්තු වන බවත් එය නොලැබීම හේතුවෙන් මෙසේ පැමිණිලි කිරීම සිදු කරන බවත් සඳහන් කර ඇත. තවද ඇය ගුරුවරුන්ට දරුවන් හැදීමට නොයන ලෙසත් තමාගේ ඉගැන්වීම් කටයුතු පමණක් සිදුකර පන්තියෙන් පිටවන ලෙසට උපදෙස් ලබාදී ඇති බවත් වැඩිදුරටත් එහිදී සඳහන් කර ඇත.

2025.07.08 දිනැති දිවුරුම් ප්‍රකාශය මඟින් විදුහල්පති වැඩිදුරටත් ලිඛිත කරුණු ඉදිරිපත් කරමින්, හෙසන්‍යා දියණිය පාසල් උපගුරුවරියක වන රසිකා වීරමන් ගුරුතුමියගේ දැඩි ඉල්ලීම මත ඇය විසින් 2021 වර්ෂයේ දී පාසලට ඇතුලත් කරගත් බවත්, ඇතුලත් කරගත් දිනයේ සිට 2025 පෙබරවාරි මස දක්වා ඇය ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යයන කටයුතු වල නිරත වෙමින් සංගීතය, බාල දක්ෂිකා යන විෂය සමගාමී ක්‍රියාකාරකම් වල යෙදෙමින් විද්‍යාලයේ ශිෂ්‍යා නායිකාවක වශයෙන් සිය පරිපාලන කටයුතු වලට ද සහය වෙමින් සාමාන්‍ය ශිෂ්‍යාවක ලෙස කටයුතු කල බවයි. 2025.02.18 දින පංතිභාර ගුරුවරයා පහරදීමක් සිදුකර ඇති බවට දෙමාපියන් 2025.02.19 වන දින සවස ඇයට දැනුම් දුන් බවත්, රාජකාරි වේලාවෙන් පසු රසිකා වීරමන් මහත්මිය ඇයගේ ස්වාමි පුරුෂයා සමඟ ඇය තනිව සිටිය දී කාර්යායට පැමිණ ඇයගේ පරිපාලනය දැඩි ලෙස විවේචනය කරමින්, ඇය මානසික අපයෝජනයට ලක්වන අයුරින් හැසිරුණු බවත්, පහරදීම සිදුවූ බව සඳහන් දින හෝ ඊට පසු දින පාසල් කාලයේ දී ඇය දැනුවත් නොකළ බවත්, ඇයගේ දෙමව්පියන් විසින් මෙම පහරදීම නිසා පංති භාර ගුරුතුමා පංති භාරකාරීත්වයෙන් ඉවත් කරන ලෙස ඉල්ලීම් කළ බවත්,කරුණු පිළිබඳව පුළුල් විමර්ශනයක් සිදුකොට එවැනි තීරණයක් ගැනීමට තීරණය කර ඒ සම්බන්ධයෙන් අංශභාර, ශ්‍රේණි භාර, අදාල පංති භාර ගුරු භවතුන්ගෙන් ලිඛිතව කරුණු විමසූ බවත් සඳහන් කර ඇත.

එසේම වැඩිදුරටත් සොයා බැලීම සඳහා 2025.02.21 දින 11 E පංතියේ දෙමාපියන්ගේ දෙමාපිය රැස්වීමක් පවත්වා ඇය විසින් දෙමාපියන්ගෙන් කරුණු විමසන ලද බවත්, එහිදී තුෂාන් නෙරංජන ගුරුතුමා ඔවුන්ගේ දරුවන්ට විෂය කරුණු හොඳන් කියා දෙන, ජීවිතය කියා දෙන, දරුවන්ට ආදරය කරන ගුරුභවතෙකු බවත්, දරුවන්ට දිගින් දිගටම ඉංග්‍රීසි විෂය පොත් නොගෙනීම නිසා ඔහු පංති වාර්තා පොතෙත් දරුවන් කිහිප දෙනෙකුගේ අතට තට්ටුවක් දැමුවත්, එම හේතුව නිසා දරුවන් කිසිවෙක් කෲරත්වයට හෝ මානසික හිංසනයට ලක්නොවූ බවත්, දරුවන්ගේ විෂය සංවර්ධනය සඳහා පොත් ගෙන ඒම සඳහා එවැනි කුඩා දඬුවමක් දීම සාධාරණ බව බහුතර දෙමාපිය මතය වූ බවත්, කිසිසේත්ම ඔහු පංති භාරකාරත්වයෙන් ඉවත් නොකරන ලෙස දෙමාපියන් ඒකමතිකව ඉල්ලීම් කළ බවත් සඳහන් කර ඇත.

මේ තත්වය හමුවේ බහුතර දෙමාපිය ඉල්ලීම අනුව ඔහු පංති භාරකාරත්වයෙන් ඉවත් නොකිරීමට ඇය තීරණය කර ගුරුවරයාට කිසිසේත්ම ඉදිරියේ දී දරුවන්ට දඬුවම් කිරීමෙන් වළකින ලෙස වාචිකවත්, ලිඛිතවත් උපදෙස් ලබාදුන් බවයි. එසේම සුලාරි ජයවර්ධන ගුරුවරියට එල්ල කළ චෝදනා සම්බන්ධයෙන් සාධාරණ ලිඛිත සාක්ෂි නොමැති කම නිසා, ඇය ද විනය භාරකාරිත්වයෙන් සහ බාලදක්ෂිකා ක්‍රියාකාරකම් වලින් ඉවත් කිරීමට පියවර නොගත් බවත් සඳහන් කර ඇත.

තුෂාන් නෙරංජන ගුරුවරයාගේ ස්ථාන මාරු වීම තුළ ඔහු පංතිභාරකාරත්වය දැරූ පංතියේ දරුවන් 44 දෙනා දැඩි ව්‍යාකූලත්වයටත්, මානසික පීඩනයටත් පත්ව ඇති බවත්, ඔහු ස්ථානමාරු වූ දිනයේ සිටම දරුවන්ගේ පාසල් පැමිණීම අක්‍රමික වූ බවත්, දියණියන් 44 දෙනාගේම අධ්‍යාපන අයිතීන්, රසිකා වීරමන් ගුරුතුමියගේ අදූරදර්ශී ක්‍රියා කලාපය නිසා උල්ලංඝනය වී ඇති බවත්, දියණියන්ගේ පාසල් නොපැමිණීම, අනෙක් දරුවන් හඬමින් මානසික පීඩනයට පත්ව කල් ගත කිරීම, රසිකා මහත්මිය එම දියණියන්ට විවිධ ප්‍රතිචාර දක්වමින් පීඩාවට පත් කිරීම යන කරුණු හේතු කොටගෙන එම දරුවන්, දෙමාපියන් මානසික අපයෝජනයට හා කෲරත්වයට පත්ව ඇති බවත්, ඔවුන්ගේ අධ්‍යාපන අයිතීන් උල්ලංඝනය වී ඇති බවත්ය.

තව ද තරුණ ගුරුවරයෙක් වන තුෂාන් නෙරංජන මහතා ද අධික ලෙස මානසික පීඩනයට ලක්ව ඔහුගේ වෘත්තීයේ යෙදී සිටීමට පවා අපහසු තත්වයට පත්ව ඇති බවත්, මෙම සිදුවීමෙන් පසු පාසල් පැමිණීම අක්‍රමික වූ බැවින් හෙසන්‍යා පාසලට එවන ලෙස මවට අවස්ථා කිහිපයක දී වාචිකවත්, එක් අවස්ථාවක දී ලිඛිතවත් දැනුම් දුන් බවත්, සියළු ක්‍රියාකාරකම්වල නිරතවෙමින් සක්‍රීයව පාසලේ ඉගෙනුම ලැබූ මෙම දියණිය මාස 5 කට ආසන්න කාලයක් දෙමාපියන් සමඟ නිවසේ හුදකලාව රැඳී සිටීම නිසා මේ වන විට මානසික පීඩනයට හෝ අවපීඩනයට පත්ව ඇත්දැයි ඇය නොදන්නා බවත්, හෙසන්‍යා දියණිය අපහසුතාවයට පත් කරන හෝ වධ හිංසා පමුණුවන කිසිදු ක්‍රියාවක් පාසල් මට්ටමෙන් සිදු වී නොමැති බවත්, පුරුද්දක් වශයෙන් ඉංග්‍රීසි පොත හා අනෙක් පොත් නිවසේ දමා එම දරුවාගේ අධ්‍යාපන සංවර්ධනයට බාධාවක් නිසා, ඇයගේ අනාගත අභිවෘද්ධියත්, විෂය සංවර්ධනයත් වෙනුවෙන් ඇයගේ පංතිභාර ගුරුතුමා ලබාදුන් සුළු දඬුවම දඬමීමා කරගෙන හෙසන්‍යාගේ මව්පියන් වන රසිකා වීරමන් මහත්මිය හා බුද්ධික මහත්මා ගෙන යන මෙම ක්‍රියාදාමය නිසා හෙසන්‍යා දියණියත්, ඇගේ පංතියේ අනෙකුත් දියණියනුත්, තුෂාන් නෙරංජන ගුරු භවතාත්, ඔහුගෙන් ඉගෙනුම ලබන අනෙකුත් දරුවනුත්, ඇය ඇතුළු තම ගුරු භවතුනුත් මෙම සිදුවීම නිසා මානසික අපයෝජනයට ලක්ව ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

03. තෙවන වගඋත්තරකරු සුලාරි උමින්දා ජයවර්ධන මිය - බාලදක්ෂිකා භාර ආචාර්ය

2025.06.27 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබාදෙමින්, ඇය ශිෂ්‍ය නායිකා හා බාලදක්ෂිකා කණ්ඩායම භාරව කටයුතු කරන බවත් විත්දිත දියණිය 07 වසරේ සිට පාසැලේ බාලදක්ෂ කණ්ඩායමේ කටයුතු කළ බවත් දියණිය විසින් ඇය සමඟ ඇයගේ පියා වැඩියෙන් ආදරේ නංගිට බව සඳහන් කර දැඩි මානසික අපහසුතාවයක සිටි බවත් මෙම දරුවා දක්ෂ දරුවෙක් බව සඳහන් කර ඇත. තව ද ඇය විසින් පාසල් ගුරුවරුන් අපේක්ෂා කළ පරිදි ඔවුන්ගේ දරුවන්ට විශේෂයෙන් සලකා ඉන්දියානු නාවික නැවක් බැලීමට ලද අවස්ථාවේ දී මෙම දරුවාද ඇතුලත්ව ගුරුවරුන්ගේ දරුවන්ට එම අවස්ථාව ලබාදුන් බව සඳහන් කර ඇත. තව ද හෙසන්‍යාගේ බාලදක්ෂිකා ජනාධිපති පදක්කම සඳහා අයදුම්පත්‍රය ඇය පුරවා මේ වන විට යොමු කළ බවයි. මෙම පැමැණිලිකරු ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම අනුව ඇය බාලදක්ෂ කඳවුරක් පවතින අවස්ථාවේදි ගිටාර් එකක් රැගෙන එන ලෙසට මෙම දරුවාට පූර්වයෙන් කරන ලද දැනුම්දීම පරිදි කඳවුර සඳහා රැගෙන නොපැමිණි බැවින් දෙමාපියන්ට ගෙනවිත් දෙන ලෙසට දරුවාට දැනුම් දුන් නමුත් කිසිදු ආකාරයට දරුවාට හිංසාවක් පීඩාවක් සිදු කිරීමක් නොකල බවත් සඳහන් කර ඇත.

2025.07.06 දිනැති දිවුරුම් ප්‍රකාශයක් මගින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරමින්, 2024 ජනවාරි මස කඩවත, බාලදක්ෂිකා ජාතික පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලද කඳවුරේදී හෙසනායා බාලදක්ෂිකාව හට කිසිදු ආකාරයක කෲර ලෙස පරිභව කිරීමක් හෝ මානසික කෲරත්වයට පත් කිරීමක් සිදු නොකළ බවත්, මෙම කඳවුරට සහභාගී වීම දෙවන පෙළ සහ පළමු පෙළ සඳහා පෙනී සිටීමට නියමිත බාලදක්ෂිකාවන්ට අත්‍යවශ්‍ය වූ බවත්, කඳවුර රාත්‍රී 3 ක් සහ දින 4ක කඳවුරක් බැවින් ඒ සඳහා දින 3 කදී පෙර පුහුණු වීම් පවත්වා සංගීත භාණ්ඩ කිහිපයක් තිබීම කඳවුරු ගිනිමැලය වර්ණවත් කිරීමට හේතු වන බැවින් සංගීත භාණ්ඩ රැගෙන පැමිණිය හැකි අය පිළිබඳව විමසූ පසු හෙසනායා දැරිය ස්වේච්ඡාවෙන්ම ගිටාරය රැගෙන පැමිණිය හැකි බව සඳහන් කළ බවයි. ඇය පොරොන්දු වූ පරිදි සිය ගිටාරය රැගෙන නොපැමිණි බැවින් ඇයගේ නිවස කිරිබත්ගොඩ පිහිටි බැවින් කඳවුරු භූමිය පිහිටි කඩවතට ගිටාරය ගෙනත් දෙන ලෙස දෙමාපියන්ට දැනුම් දෙන ලෙස ඇයට පැවසීමෙන් පසු ඇයගේ දෙමාපියන් විසින් කඳවුරු ගිනිමැලය පවත්වන දින එය රැගෙන පැමිණියද ගිනිමැල ගීත පෙර දින පුහුණු කළ නිසාවෙන් එය ප්‍රයෝජනවත් නොවූ බවත් සඳහන් කර ඇත.

තව ද බාලදක්ෂිකා නායිකාවක ලෙස සහ කොමසාරිස්වරියක ලෙස ස්වේච්ඡා සේවා කාලය වසර 27 කාලය තුළ කිසිම දෙමාපියෙකු හෝ දරුවෙකු ඇයට එරෙහිව මෙවැනි චෝදනාවක් එල්ල කර නොමැති බවත්ය. මේ වන විට බාලදක්ෂිකාවන් 10 දෙනෙකු පමණ සිය පළමු පෙළ සඳහා සූදානම් වෙමින් සිටින බවත්, පාසලේ ඇතැම් ගුරුභවතුන්ගේ දරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබීම ඔවුනගේ අපේක්ෂාව වන අතර රසිකා වීරමන් ගුරු මහත්මිය විසින් ඇතැම් අවස්ථා වලදී බාලදක්ෂිකාවන් විසින් සිදු කළ යුතු ක්‍රියාකාරකම්වලට ඉදිරිපත් නොවී ඇගේ දරුවාට එයට අදාල සහතිකය ලබා ගත හැකිද යන්න විමසා ඇති බවත්, එම කිසිදු බලපෑමක් නොතකා සියලු දරුවන්ට එක සේ සලකමින් කටයුතු කළ බවත් දරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කළ බවත්, ඇයට එරෙහි චෝදනා ප්‍රතික්ෂේප කරන බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

4. සිව්වන වගඋත්තරකරු- කොළඹ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

2025.07.08 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශය සඳහා අධ්‍යක්ෂ වෙනුවෙන් සහකාර අධ්‍යක්ෂ ඊ.ඒම්.සී.පී. ඒදිරිසිංහ මිය සහභාගී වෙමින්, මෙම සිදුවීම සම්බන්ධයෙන් කලාප කාර්යාලය විසින් විමර්ශනයක් පවත්වා ඇති බවත්, පරීක්ෂණ කමිටුව පන්තිභාර ගුරුවරයා වෙනත් පාසලක් වෙත ස්ථාන මාරු කිරීමටත්, සුලාරි මහත්මියට සිසුන් සමඟ කටයුතු කිරීමේ දී සිසුන්ට බැණ වැදීමෙන් වළකින ලෙස අවවාද කිරීම, රසිකා වීරමන් මහත්මියට පැමිණිල්ලට අදාළ කරුණු විමසමින් අනෙක් සිසුන්ට බලපෑම් කිරීමෙන් වළකින ලෙස අවවාද කිරීම සහ දෙමාපියන්ගේ ලිඛිත ඉල්ලීම අනුව සිසුවියට සුදුසු පාසලක් ලබාදීමට කටයුතු කිරීම නිර්දේශ ලෙස ඉදිරිපත් කර ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇත.

එහි පළමු නිර්දේශය වන පන්ති භාර ගුරුවරයා වෙනත් පාසලකට ස්ථාන මාරු කිරීම් ඒ වන විටත් සිදුකර ඇති බවත්, සිසුවිය සඳහා සුදුසු පාසලක් ලබාදීමට කටයුතු කළ හැකි බවත් ඉදිරියේ දී අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නියමිත බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

5. අධිකරණ වෛද්‍ය වාර්තාව

2025.06.19 වන දින දරුවා අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. එහි රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය තුළ *"යශෝධරා බාලිකා විද්‍යාලය බොරැල්ල, 11 ඊ පන්තියේ දී උදෑසන 09.20ට දන්නා පුද්ගලයකු විසින් වාචිකව හා ශාරීරික හිංසනයට ලක් කළ බව"* සඳහන් කර ඇත.

තුවාල සටහන තුළ ශරීරයේ තුවාලයක් හඳුනාගෙන නොමැති බවත්, 2025.06.19 වන දින රිජ්වේ ආර්යා ළමා රෝහලේ දී මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් (Case conference) පවත්වා ඇති බවත් එහි වාර්තාව ඇමුණුම් ලෙස ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත.

**6. රිජ්වේ ආර්යා ළමා රෝහලේ දී සිදුවීමට අදාළව පවත්වන ලද සාකච්ඡාවේ (Case conference) වාර්තාව**

සායන අංක DH431/25 යටතේ 2025.06.19 වන දින රිජ්වේ ආර්යා ළමා රෝහලේ දී සිදුවීමට අදාළව සාකච්ඡාවක් පවත්වා ඇති අතර ඒ සඳහා එම රෝහලෙහි ළමා හා යොවුන් මනෝ චිකිත්සාව පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළුව අධිකරණ වෛද්‍ය නිලධාරී, පරිවාස නිලධාරී, ළමා ආරක්ෂණ අධිකාරියේ නිළධාරීන් සමඟ 13 දෙනකු සඳහා සහභාගී වී ඇති බව නිරීක්ෂණය වේ.

එහි කෙටි සායනික ඉතිහාසය ලෙස, සෙතුනි 7 ශ්‍රේණියේ දී යශෝධරා විද්‍යාලයට ඇතුලත්ව බාලදක්ෂ කටයුතු වල නිරතව ඇති බවත්, 2023 වසරේ සිට බාලදක්ෂ භාර ගුරුවරිය ඇය අයුතු සැලකීමකට සහ අනෙකුත් ගුරුවරුන් හා සිසුන් ඉදිරියේ දි වාචිකව හිංසනයට ලක්කර ඇති බවත් සඳහන් කර ඇත. තව ද ඇයගේ උත්සහයන් අවතක්සේරු කිරීමට, බාලදක්ෂ පදක්කම් ලබා ගැනීමට ඇයට තිබූ හැකියාව ප්‍රමාද කළ බවත් මේ සම්බන්ධයෙන් පාසල් පරිපාලනය දැනුවත් කිරීමෙන් පසු ඇයගේ තත්වය සමීපව අධ්‍යයනය කිරීමට පන්ති භාර ගුරුවරයා පත් කළ බවත්, ඇයට පන්ති භාර ගුරුවරයා බාලදක්ෂ භාර ගුරුවරයාට පක්ෂපාතී බව හැඟුන බවත්, පාසලේ ශිෂ්‍ය නායකයන්ගේ විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඇයව වෙන් කිරීමට පටන්ගත් බවත් සඳහන් කර ඇත. දිගින් දිගටම සිදුවන හිරිහැරවල ප්‍රතිඵලයක් ලෙස ඇය වැඩි වැඩියෙන් කෝපයට පත් වන බවත්, ගුරුවරුන්ට එරෙහිව පළිගැනීමට පෙළඹෙන බවත්, බියකරු සිහින දකින බවත්, දුක්ඛිත මතකයන් නැවත අත්විඳින බවත් එහි වැඩිදුරටත් සඳහන් කර ඇත.

චෝදනා එල්ල වූ සිදුවීම සම්බන්ධයෙන් දරුවා සමඟ කළ සායනික සම්මුඛ සාකච්ඡාවට අදාළව පහත කරුණු සඳහන් කර ඇත.

2025 පෙබරවාරි 18 වන දින, පාසල් පොතක් ගෙන රැගෙන නොඒම හේතුවෙන් සෙතුනිගේ පන්තිභාර ගුරුවරයා ඇගේ වම් අතට දෘශ්‍යමාන සලකුණක් ඉතිරිවන පරිදි වාර්තා පොතකින් පහර දුන් බවත්, සිද්ධියෙන් පසු, ඇය කෑ ගසා, නැගිට පන්ති කාමරයෙන් පිටතට ගොස් ඇගේ මව සොයා ගිය බවත්, ඒ වන විට ඇය වෙනත් පන්ති කාමරයක සිටි බවත්, සිදු වූ දේ ඇගේ මවට පැවසූ බව ඇයට මතක් වූ නමුත් පාසලෙන් පිටවීම හැර ඉන් පසුව සිදු වූ සිදුවීම් පිළිබඳ පැහැදිලි මතකයක් ඇයට නැති බවත්, මෙම සිද්ධියෙන් පසු ඇය නැවත පාසලට යාමට උත්සාහ කළ නමුත්, අනෙක් සිසුන් ඉතා ප්‍රිය කරන ගුරුවරයෙකු ගැන ඇය පැමිණිලි කිරීම නිසා අනෙකුත් සිසුන් විසින් සමාජීය වශයෙන් ඇයව හුදකලා කළ බව එහිදී සඳහන් කර ඇත.

ළමා හා නව යොවුන් මනෝචිකිත්සක විසින් දරුවාගේ වත්මන් මානසික තත්ත්වය තුළ, පශ්චාත් කම්පන ආතති ආබාධයේ ලක්ෂණ මෙන්ම මිශ්‍ර කාංසාව සහ මානසික අවපීඩන රෝග ලක්ෂණ ද දක්නට ඇති බවත්, ඇය මනෝ වෛද්‍ය උපදේශකවරයෙකුගේ රැකවරණය යටතේ පෞද්ගලික අංශයේ ප්‍රතිකාර ආරම්භ කර ඇති අතර ඇගේ රෝග ලක්ෂණ අර්ධ වශයෙන් සමනය වෙමින් පවතින බවත්, ඇයගේ මානසික සෞඛ්‍ය ගැටළු සඳහා රිජවේ ආර්යා ළමා රෝහලේ ප්‍රතිකාර ලබාදීමට කටයුතු කළ ද, දෙමාපියන් පෞද්ගලික උපදේශකවරයා යටතේ අඛණ්ඩව ප්‍රතිකාර ලබා ගැනීමට කැමති වූ බවත්, සිද්ධියෙන් පසු දරුවා නිතිපතා පාසල් නොයන නමුත් නිවසේ සිටම ඇගේ අධ්‍යයන කටයුතු කරගෙන යන බවත්, ඇය නැවත එම පාසලටම යාමට පැහැදිලිවම අකමැත්ත පළ කළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙම සිදුවීම පිළිබඳ සාකච්ඡාවේ දී (Case conference) දරුවාගේ මානසික සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබාදීම අවශ්‍ය බව සහ අඛණ්ඩ අධ්‍යාපනය තහවුරු කළ යුතු බවට නිර්දේශ කර ඇත.

**නිරීක්ෂණ -**

- ඉදිරිපත් කර ඇති ලේඛන අනුව, පන්ති භාර ගුරු මහතා විසින් දියණියට පහර දුන් බවට චෝදනා කරමින් දෙමාපියන් විසින් 2024.02.19 දිනැතිව විදුහල්පති වෙත ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, අදාළ චෝදනාව සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස විදුහල්පති විසින් 2025.02.20 දින 11 ශ්‍රේණිය භාර අංශ ප්‍රධානීන් වෙත දැනුම් දී ඇත.

ඒ අනුව, 10-11 ශ්‍රේණි අංශ ප්‍රධානී සුනන්ද මහතා විසින් විදුහල්පති වෙත යොමු කරන ලද 2025.02.20 දිනැති ලිපිය මගින්, හෙසන්‍යා සිසුවිය සම්බන්ධයෙන් කරුණු සොයා බැලූ බවත්, එය විශේෂ සිදුවීමක් නොවන බවත් සඳහන් කර ඇත. තමන් සිංහල විෂය ඉගැන්වීම සඳහා පන්තියට යන අවස්ථාවේදී පන්ති භාර ගුරු තුෂාන් නෙරංජන මහතා පන්තිය තුළ රැඳී සිටිමින් සිසුන්ගේ පොත් පරීක්ෂා කළ බවත්, එහිදී ඔහු අතේ තිබූ පන්ති වාර්තා පොතෙන් හෙසන්‍යා දියණිය ඇතුළු සිසුන් කිහිප දෙනෙකුට තට්ටුවක් දැමූ බව තමන් දුටු බවත් එහි දැක්වේ. එසේම, එම දියණිය සනීපාරක්ෂක අවශ්‍යතාවක් සඳහන් කර පන්තියෙන් පිටව ගිය බවත්, ඉන්පසු තමන් පන්තිය තුළ රැඳී සිටි කාලපරිච්ඡේද දෙක තුළම ඇය නැවත නොපැමිණි බවත් අදාළ ලිපියේ සඳහන් වේ. කෙසේ වෙතත්, සිසුවිය පන්ති කාමරයෙන් පිටතට ගොස් කාලපරිච්ඡේද දෙකක් ගතවන තුරුත් නැවත නොපැමිණීම සම්බන්ධයෙන් ගුරුවරයාගේ අවධානය යොමු වී නොමැති බවත්, ඔහු එය සාමාන්‍ය සිදුවීමක් ලෙස සලකා ඇති බවත් මෙමගින් නිරීක්ෂණය වේ.

තවද, 11 ශ්‍රේණි අංශ ප්‍රධානී කුමුදුනී මහත්මියගේ 2025.02.20 දිනැති ලිපියට අනුව, 2025.02.21 දින පෙ.ව 7.45 ට දෙමාපිය රැස්වීමක් කැඳවා, තුෂාන් ගුරු මහතා සම්බන්ධයෙන් දෙමාපියන්ගේ අදහස් විමසා අදාළ වාර්තාව විදුහල්පතිවරයා වෙත යොමු කර ඇති බව නිරීක්ෂණය වේ.

- වගඋත්තර තුෂාන් නෙරංජන මහතා විසින් '11-ඊ පන්තියේ හෙසන්‍යා ශිෂ්‍යාව සම්බන්ධව' මැයෙන් විදුහල්පතිවරයා වෙත යොමු කරන ලද 2024.02.21 දිනැති ලිපියෙහි , 2025.02.18 දින ඉගැන්වීම් කටයුතුවලින් පසුව ගෙදර වැඩ පරීක්ෂා කිරීමේදී, හෙසන්‍යා ඇතුළු සිසුන් 10 දෙනෙකු අදාළ අභ්‍යාස සම්පූර්ණ කර නොතිබූ බවත්, හෙසන්‍යා ශිෂ්‍යාව සතුව අභ්‍යාස පොත ද නොතිබූ බවත් එහි සඳහන් වේ. ඒ අනුව නැවත වැඩ කරන ලෙස උපදෙස් දෙමින් තමන් විසින් පන්ති වාර්තා පොතෙන් ඇයගේ අතට තට්ටු කිරීමක් සිදු කළ බවත්, ඊට සිසුන් සාමාන්‍ය පරිදි ප්‍රතිචාර දැක්වූ බවත් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත.

තවද, මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලිඛිත හා වාචික කරුණු දැක්වීම් සිදු කරමින් වගඋත්තරකරු අවධාරණය කර ඇත්තේ, අදාළ ශිෂ්‍යාව මෙවර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට නියමිත බැවින් පාසල් වැඩ කටයුතු අතපසු නොකරන ලෙස අවවාද කරමින් සෙමින් තට්ටු කිරීමක් පමණක් සිදු කළ බවයි. පැමිණිලි පාර්ශවය චෝදනා කරන පරිදි, ශරීරය නිල් පැහැ ගැන්වෙන තුරු පහරදීමක් තමා විසින් සිදු නොකළ බව හෙතෙම සඳහන් කරයි. මෙම සිදුවීම මුල් කරගනිමින් දිගින් දිගටම ගැටලු මතු වූ බැවින්, විදුහල්පතිවරිය විසින් පන්තියේ සියලුම දෙමාපියන් කැඳවා කරුණු විමසා ඇති බවත්, එහිදී සහභාගී වූ දෙමාපියන් ගුරුවරයාගේ ක්‍රියාකලාපය අනුමත කරමින්, ඔහු සම්බන්ධයෙන් ගැටලුවක් නොමැති බවට සහ ගුරු භූමිකාවට අනවශ්‍ය බලපෑම් නොකරන ලෙසට ඉල්ලා ලිපියක් ලබා දී ඇති බවත් වාර්තා කර ඇත. කෙසේ වෙතත් උක්ත කරුණු අනුව, 'පහරදීමක්' යනු ශරීරයේ නිල් පැහැති සලකුණු ඇති වීමක් බවට වගඋත්තරකරු විසින් වැරදි

ආකල්පයක පිහිටා අර්ථකථනය කරගෙන ඇති බව පෙනී යයි. ඒ අනුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016 සහ 2012/37 දරන චක්‍රලේඛවලට අනුකූලව ගුරු භූමිකාව සම්බන්ධයෙන් නිසි අවබෝධයක් වගඋත්තරකරු සතුව නොමැති බව නිරීක්ෂණය වේ.

- 2025.02.21 දිනැතිව දෙමාපියන් 25 දෙනෙකුගේ අත්සනින් යුතුව විදුහල්පති වෙත යොමු කරන ලද ලිපියේ, 11-ඊ පන්තිය භාර ගුරු තුෂාන් නෙරංජන මහතා විසින් විෂය කටයුතු අතපසු කිරීම හේතුවෙන් ලබා දුන් සුළු දඬුවම පදනම් කරගෙන, පන්තියේ ඉතා සුළු දෙමාපිය පිරිසක් විසින් සිදුකරනු ලබන බලපෑම් හා යෝජනා, බහුතරයක් ප්‍රතික්ෂේප කරන බව අවධාරණය කර ඇත. සිසුන්ගේ සුබසිද්ධිය උදෙසා ගුරුවරයා විසින් එවැනි දඬුවම් ලබාදීම සම්බන්ධයෙන් ඔවුන්ගේ විරෝධතාවක් නොමැති බව ද එහි සඳහන් කර ඇත. අදාළ ලිඛිත ප්‍රකාශයට එකඟ වන අය පමණක් එහි අත්සන් තබා අනුමැතිය පළ කරන බව ලිපිය ආරම්භයේම දක්වා ඇත.කෙසේ වෙතත්, 11-ඊ පන්තියේ සමස්ත සිසුන් සංඛ්‍යාව 45ක් වුවද, ඉහත ප්‍රකාශයට එකඟත්වය පළ කර ඇත්තේ දෙමාපියන් 24 දෙනෙකු පමණක් බවත්, ඒ අනුව තවත් දෙමාපියන් 20 දෙනෙකු ඊට එකඟත්වය පළ කර නොමැති බවත් නිරීක්ෂණය වේ. එසේම අදාළ රැස්වීම සඳහා සහභාගී වූ දෙමාපියන්ගේ පැමිණීමේ ලේඛනයේ සටහන්ව ඇත්තේ අත්සන් 24ක් පමණක් බව ද පෙනී යයි. තවද, උක්ත ලිපිය තුළ 'සුළු දෙමාපිය පිරිසකගේ බලපෑම් සහ යෝජනා' යනුවෙන් සඳහන් කර ඇති බැවින්, ගුරුවරයාට එරෙහිව මෙම ඉල්ලීම හෝ විරෝධතාව ඉදිරිපත් කර ඇත්තේ වින්දිත දැරියගේ දෙමාපියන් විසින් පමණක් බවට නිශ්චිතව තහවුරු කළ නොහැකි බව නිරීක්ෂණය වේ.

- 2025.02.21 දින පෙ.ව. 7.45 ට පැවති රැස්වීම් වාර්තාව අනුව, පන්ති භාර ගුරු තුෂාන් නෙරංජන මහතා විසින් පන්තියේ සිසුන්ට ලබා දුන් දඬුවමක් හේතුවෙන් උද්ගත වී ඇති ගැටලුකාරී තත්ත්වය සහ ඒ පිළිබඳව දරුවන් විසින් දෙමාපියන් දැනුවත් කර ඇත්ද යන්න සාකච්ඡා කිරීම සඳහා මෙම රැස්වීම කැඳවූ බව, ශ්‍රේණි භාර ආචාර්යවරුන් වන කුමුදුනී සහ සුනන්ද යන මහත්ම මහත්මීන් විසින් දෙමාපියන් වෙත දැනුම් දී ඇති බව පෙනී යයි. එහිදී විදුහල්පතිවරයා විසින් ගැටලු ඉදිරිපත් කරන ලෙස කළ දැනුම් දීමට අනුව අදහස් දැක්වූ සියලුම දෙමාපියන් සඳහන් කර ඇත්තේ, ගුරුවරයා විසින් පවරා තිබූ පැවරුම් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් මෙලෙස සුළු දඬුවමක් ලබා දී ඇති බවත්, එය එසේ සිදු විය යුතු බවත්, දරුවන් ද තමන්ගේ වරද පිළිගෙන ඇති බවත් ය.

එමෙන්ම, අදාළ සිසුවිය කණ්ඩායම් ක්‍රියාකාරකම්වලදී අනෙක් සිසුන්ගෙන් වෙන්ව සිටින බවත්, ඇය යම් මානසික අසමතුලිතතාවක් (විෂාදය වැනි) හේතුවෙන් ඖෂධ ලබා ගන්නා බවත් ඇතැම් දෙමාපියන් ප්‍රකාශ කර ඇති අතර, එය ඇයගේ පෞද්ගලික ගැටලුවක් විය හැකි බවත්, පන්ති භාර ගුරු මහතා කිසිවිටෙකත් දරුවන්ට දැඩි දඬුවම් ලබා නොදෙන බවත් පැමිණ සිටි සියලු දෙමාපියන් ඒකමතිකව ප්‍රකාශ කර ඇති බව එම වාර්තාවේ සටහන්ව ඇති බව නිරීක්ෂණය වේ. ගුරුවරයා විසින් දඬුවම් කිරීම හේතුවෙන් පැන නැඟුණු ගැටලුකාරී තත්ත්වය මත මෙම රැස්වීම කැඳවූ බව සඳහන් කර ඇතත්, සිද්ධියට අදාළව පන්තියේ සිසුන්ගෙන් නිසි පරිදි කරුණු විමසීමට පෙර මෙම දෙමාපිය රැස්වීම කැඳවා ඇති බව නිරීක්ෂණය වේ. එසේම, මෙම දඬුවම් කිරීම දරුවන්ගේ යහපත උදෙසා සිදු කරන ලද්දක් බව හුවා දක්වමින්, එම ක්‍රියාව සාමාන්‍යකරණය කිරීමට කටයුතු කර ඇති බව ද නිරීක්ෂණය වේ.

- තුෂාන් නෙරංජන ගුරු මහතා සම්බන්ධයෙන් 11-ඊ පන්තියේ සිසුන්ගේ අදහස් අහඹු ලෙස විමසීමක් සිදු කළ බව දක්වමින්, ඊට අදාළ ලේඛන ඇතුළත් ගොනුවේ පිටපත් විමර්ශන අවස්ථාවේදී විදුහල්පතිවරිය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එහි සිසුන් 27 දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද සටහන් තුළ පහත කරුණු අන්තර්ගත වේ.

එම සටහන් පරීක්ෂා කිරීමේදී ඇතැම් සිසුන් 2025.03.03 දිනැතිව සිය අදහස් දක්වා ඇති බවත් නිරීක්ෂණය වේ.කෙසේ වෙතත්, 2025.02.21 දින පැවති දෙමාපිය රැස්වීමේදී විදුහල්පතිවරයා ඇතුළු ගුරුවරුන් විසින් දෙමාපියන් වෙත ඉදිරිපත් කරන ලද කරුණු සහ ආකල්පවල යම් බලපෑමක්, සිසුන්ගේ මෙම අදහස් දැක්වීම් කෙරෙහි යොමු වීමට ප්‍රමාණවත් කාල පරාසයක් (පෙබරවාරි 21 සිට මාර්තු 03 දක්වා) ලැබී ඇති බව මෙම දින වකවානු සැසඳීමේදී නිරීක්ෂණය වේ.

> *"2025.03.03 දිනැතිව, ....තුෂාන් සර් කියන්නේ ගුරුවරයෙන්නේ ඉතින් ගුරුවරයෙන් ළමයෙක් වැඩ කලේ නෑ කියලා ගැහුව ප්‍රශ්නයක් නෑ...ගහනවා බනිනවා තමයි ඒත් කවදාවත් හයියෙන් රිදෙන්න ගහන්නේ නෑ හිත රිදෙන්න බනින්නෙත් නෑ. වෙන ගුරුවරු වාගේ නෙමෙයි අපිත් එක්ක උඹ, බං කියලා කතා කලාට කවදාවත් එහෙම නරක වචන වලින් බැනලා නෑ...".*

> *"2025.03.03 දිනැතිව,... අපි ගෙදර වැඩ කරන් නාවොත් අපිට ගැහුවට, බැන්නට....සර් සමහර වෙලාවට පන්තියේ නරක වරිත තියෙන ළමයින්ට වෙනුවට අපිට උපදෙස් දෙනකොට පොඩි කේන්තියක් ආවත්....සර් ගහනවට අපේ අම්මලා උනත් කැමති ඒකයි.."*

> *"..සර් අපිට බැන්නත් , ගැහුවත් ඒක අපේ හොඳට කරන්නේ..."*

> *"...හොම් වර්ක් කරේ නැති උනාම බනිනවා, ගහනවා තමා එහෙම බනින, ගහන නිසා තමා අපි වැඩ කරන්නේත් ඒක නිසා මම එහෙම බනින, ගහන එකේ වැරැද්දක් දකින්නේ නෑ..."*

> *"..වැරැද්දක් කළාම අපිට බනිනවා සමහර වෙලාවට ගහනවා මම හිතනවා ඒක තමා ගුරුවරයෙන්ගේ හැටි කියලා .."*

> *"..මමත් සර්ගෙන් ගුටි කාපු ළමයෙන ඒත් මට ඒකේ ප්‍රශ්නයක් නෑ මොකද තුෂාන් සර් කවදාවක් අපිට සත්තුන්ට වගේ ගහලා නෑ.ගුරුවරයෙක්ගෙන් ගුටි කන්න බැරි තරම් මහන්තත්තකමක් අපේ වයස ළමයින්ට සුදුසු නෑ කියලයි මම නම් දකින්නේ..."*

> *"..ඉස්සර අපේ ක්ලාස් එක භාර වෙන්න කලින් හිතන් හිටියේ මාරම නපුරු, ළමයින්ට ගහන කෙනෙක් කියලා.."*

> *"...He beats us if we haven't done our work properly.."*

> *" ....Home work කරේ නැති වුණාම ඕනෙම teacher කෙනෙක් punish කරනවනේ Thushan sirනුත් ඒ වගේම බැන්නට පොඩ්ඩක් ගැහුවට අපිත් එක්ක හිනා වෙලා..."*

*"..අපි වැඩ නොකර ගැහුවාම අපි ඊළඟ දවසේ ඒ වැරැද්ද කරන්නේ නෑ.ගැහුවත් අපි ඒක ජොලියේ හිනාවෙලා වැරැද්ද පිළිගන්නවා..."*

*"...සර් අපිට ගැහුවත් අපි ගෙවල් වල ගිහින් කියන්නේ නැහැ...."*

*"...සර් ළමයින්ට දඬුවම් කරන්නේ දුන්නේ වැඩ හරියට කරන් ආවේ නැත්නම් විතරයි.."*

*"....ඇත්තටම සර් ලොකුවට ගහන කෙනෙක් නෙවෙයි.හැබැයි සර්ගේ විශ්වාට අපිට දීලා, අපේ අතින ඒක කඩ උනොත් අපිට ගුටි කන්න වෙනවා.එච්චාට ඒ බයට අපි වැඩ ටික හොඳට කරන් ගියා මිසක් කවදාවත් ගහපු නිසා තරහක් ආවේ නෑ.ඒ අපේ වැරදි, අපේ හොඳටම කරන rules.."*

- සිසුන් විසින් ඉහත පරිදි ඉදිරිපත් කර ඇති කරුණු අනුව, පන්ති භාර ගුරුවරයා වශයෙන් කටයුතු කළ පළමු වගඋත්තර තුෂාන් මහතා විසින් පන්ති කාමරය තුළදී සිසුවියන්ට පහර දීම් සිදු කර ඇති බව තහවුරු වේ. එසේ වුවද, විදුහල්පතිවරිය ඒ සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු කර කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. තෙවන වගඋත්තර විදුහල්පතිවරිය විමර්ශන අවස්ථාවේදී සහ ලිඛිතව කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, පන්තියේ සිසුන්ගෙන් ලබාගත් ප්‍රකාශ මගින් ගුරුවරයා පහර දෙන බවට කරුණු අනාවරණය නොවූ බැවින් ඒ පිළිබඳ කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු නොකළ බවයි. එක් සිසුවියක් මෙවැනි ප්‍රකාශයක් සිදු කළ පමණින් පන්ති භාර ගුරුවරයා මාරු කිරීමට නොහැකි බවත්, ඔහුට එරෙහිව වෙනත් කිසිදු සාක්ෂියක් නොමැති බවත් ඇය වැඩිදුරටත් සඳහන් කර ඇත. කෙසේ වෙතත්, සිසුන්ගේ ලිඛිත ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී ගුරුවරයා විසින් පහර දීම් සිදු කර ඇති බවට කරුණු තහවුරු වී තිබියදීත්, විදුහල්පතිවරිය ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව නිරීක්ෂණය වේ.

- තවද, 2012/37 චක්‍රලේඛයේ 5.2 (ඇ) වගන්තිය අනුව සිසුන්ට නමින් හෝ 'දුව', 'පුතා' යනුවෙන් ආමන්ත්‍රණය කළ යුතු බව දක්වා ඇත. එසේ වුවද, යශෝධරා විද්‍යාලයේ විදුහල්පතිවරිය විසින් සිසුන්ගේ අදහස් ලබාගෙන ඇති ලේඛන පරීක්ෂා කිරීමේදී, අදාළ පන්ති භාර ගුරුවරයා ගුරු වෘත්තියට නුසුදුසු අයුරින් දරුවන්ට "උඹ", "බං" වැනි වචනවලින් ආමන්ත්‍රණය කර ඇති බව නිරීක්ෂණය වේ.

- 2025.07.08 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේදී පැමිණිලිකරු විසින් කරුණු දක්වා ඇත්තේ, වින්දිත දැරියට පමණක් නොව, එම පාසලේම ගුරුවරියක ලෙස සේවය කරන ඇයගේ මවට ද පාසල තුළ සිය රාජකාරි කටයුතු සිදු කිරීමට නොහැකි බාධාකාරී වාතාවරණයක් නිර්මාණය වී ඇති බවයි. විශේෂයෙන්ම, සිසුන් විසින් ගුරුවරියට එරෙහිව පාසල් පරිශ්‍රය තුළ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සහ සමාජ මාධ්‍ය ඔස්සේ විවිධ ප්‍රකාශ සිදු කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇති බව සඳහන් කරමින්, ඊට අදාළ සාක්ෂි ලේඛනවල පිටපත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම ලේඛනවල අන්තර්ගත කරුණු පහත පරිදි වේ.

*"රසිකා මිස්ට ලියමි..*
*..අනේ මම කොතරම් -නීච ලෙස පාසලක්*
*වනසා දැමාවාදැයි - ඔබට සිතුනේ නොවෙද ......*

...ඔබේ දියණිය රෝගියකු නම්- ඔබ දන්නවා නොවේ ද ඒ
රෝගයේ දරුණු බව- අන් දියණියෝ දැන් එයට යටකි..."

"ආදරණීය රසිකා ගුරුතුමිය වෙතයි,
කරුණාකරලා තමන්ගේ ලමයට කිසියම් හෝ මානසික ලෙඩක් තිබේනම් ඇයව හැකි ඉක්මනින් අන්ගොඩට යොමු කරන්න එහෙම නොකර කලාපෙට ගිහින් කට උත්තර දෙන්න එපා ලැජ්ජ නැති වැඩ කරන්න එපා තමන්ගේ ගෞරවය තියාගන්න ඔයත් ගුරුවරියක්නේ (රසිකා) තවත් ගුරුවරයෙක් ලමයෙක්ට තරවටු කරන්නේ එම ලමයා අත වැරද්දක් තිබූ නිසාය. ඔබේ ලමයාද එදින පාසල් වැඩ මාස දෙකක පමන කර තිබුනේ නැත සෑම ලමයෙක්ම එදින ගුටිකෑවේය.. ඔබේ ලමයාට කුමන් හෝ විශේෂත්වයක් තිබෙනවානම් කරුණාකර ඇයව විශේෂ අවශ්‍යතා ඇති පාසලකට ඇතුලත් කරන්න (වාතයක් වෙනවා කියලා මෙහෙම වාතයක් වෙන්න එපා අප්පිරියයි )"

- 2025.07.08 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේදී අදහස් දැක්වූ විදුහල්පතිවරිය, පාසල තුළ සිසුන්ගේ හැසිරීම් පාලනය කළ නොහැකි මට්ටමකට පත්ව ඇති බව ප්‍රකාශ කර ඇති අතර, ඊට සාක්ෂි වශයෙන් පාසල තුළ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් කිහිපයක් ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම ලේඛනවල පහත සඳහන් කරුණු අන්තර්ගත වී ඇති බව නිරීක්ෂණය වේ.

"....ගුරු වෘත්තිය කිලිටි වී -ඇත්තේ මය නීචයන් අතින්..."

"..මනසක් ඇති ගුරු නීචයෙක් - නම රසිකා ටීච යැයිලත් ..."

" ... අපේ සර් ගැහුවේ වැරැද්දට නොවෙද
හදාගන්නෙපැයි ඇය ඇගෙ ළමයව

සර් ඉතින් අපේ වැරැද්දටත් අපිටත් ගහලා තිබේ
ඕන තරම් අපිත් ඉතින් බැනුම් හැබැයි අහලා තිබේ
හැම ගුරුවරයගෙම හිතේ තරහක් නම් නැහැනෙ අනේ
අපේ හිසට කිරුළු පළන්දන්නයි සර් එහෙම කළේ.."

"....ඉතින් අනේ පෙත්සම් ගහනා විද්‍යා ගුරු මවුනේ...
අපේ කටෙන් නැගෙන ශාපෙ දිනෙක ඔබ සැමට වැදෙන්නේ.."

- ඉහත දැන්වීම්වල අන්තර්ගත කරුණු සැලකිල්ලට ගැනීමේදී, යශෝධරා විද්‍යාලයේ සිසුන්ගේ ආකල්ප හා සාරධර්ම පවතින තත්ත්වය පිළිබඳව පුළුල් සමාලෝචනයක් සිදු කළ යුතු බවත්, ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර යහපත් පාසල් පරිසරයක් නැවත ස්ථාපිත කිරීම සඳහා කඩිනමින් පියවර ගත යුතු බවට කොමිෂන් සභාව විසින් කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත දැනුම් දී තිබුණි. ඊට ප්‍රතිචාර වශයෙන් අංක බප/කො/කලාප/පාපා03/විනය/2025 හා 2025.10.02 දිනැති ලිපිය මගින් කරුණු දක්වා ඇති අතර, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් මේ පිළිබඳව පාසල් සිසුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව එමගින් සඳහන් කර ඇත.

- කලාප අධ්‍යාපන කාර්යාලය මගින් පවත්වන ලද පරීක්ෂණ කමිටු වාර්තාවේ පිටපත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එහි දී ගුරුවරුන් 06 දෙනෙකු, 11-ඊ පන්තියේ සිසුන් තිදෙනෙකු (03) සහ බාලදක්ෂ කටයුතුවල නිරත සිසුන් පස්දෙනෙකුගෙන් (05) ප්‍රකාශ සටහන් කරගෙන ඇති බව නිරීක්ෂණය වේ. ඉහත පරීක්ෂණ මණ්ඩල නිර්දේශ පදනම් කරගනිමින්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් 2025.07.15 දිනැති ලිපිය මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත කරුණු වාර්තා කර ඇත. පන්ති භාර ගුරු තුෂාන් නිරංජන මහතා විසින් පන්ති වාර්තා පොත භාවිත කරමින් වින්දිත දැරියට පහර දී ඇති බවත්, ඒ අනුව අංක 12/2016 දරන චක්‍රලේඛයේ 2, 4 (iii) වගන්ති හා ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය යටතේ ඔහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත හැකි බැවින්, අදාළ ගුරුවරයා වෙනත් පාසලකට ස්ථාන මාරු කිරීම සුදුසු බවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ කර ඇති බව නිරීක්ෂණය වේ.

- කලාප අධ්‍යාපන කාර්යාලයේ පරීක්ෂණ කමිටු වාර්තාවේ නිරීක්ෂණ අංක 08 යටතේ සිසුන්ගේ ප්‍රකාශ ඇසුරින් දක්වා ඇත්තේ, වින්දිත දැරිය බාහිර වැඩ කටයුතු අධික වීම හේතුවෙන් මානසික ආතතියෙන් පෙළෙන බවත්, ඇය එක් අවස්ථාවකදී සියදිවි නසා ගැනීමට පවා උත්සාහ කර ඇති බවට ප්‍රකාශයක් මගින් අනාවරණය වී ඇති බවත් ය. තවද, දැරියගේ මානසික තත්ත්වය සලකා බලා එම විමර්ශනයේදී ඇයගෙන් ප්‍රකාශයක් ලබාගෙන නොමැති බව ද සඳහන් කර ඇත. කෙසේ වෙතත්, මෙම සඳහන් කර ඇති සියදිවි නසා ගැනීමේ උත්සාහය සම්බන්ධයෙන් පාසල් උපදේශන ගුරුවරියගේ වාර්තාවල, රිජ්වේ ආර්යා ළමා රෝහලේ මනෝචිකිත්සක වාර්තාවේ හෝ පෞද්ගලික උපදේශන හා මනෝචිකිත්සක වෛද්‍යවරයා ලබා දී ඇති කිසිදු ලේඛනයක කරුණු අනාවරණයවීමක් නොමැති බව නිරීක්ෂණය වේ.

- කලාප අධ්‍යාපන කාර්යාලයේ පරීක්ෂණ කමිටු වාර්තාවේ නිර්දේශයන්ට අනුව, අංක බප/කො/කලාප/ගුරුපා 26 හා 2025.07.01 දිනැති ලිපිය මගින් පන්ති භාර ගුරුවරයාට සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. මෙම ස්ථාන මාරුව හේතුවෙන් යශෝධරා විද්‍යාලයේ ඉංග්‍රීසි විෂය ඉගැන්වීම සඳහා ගුරු හිඟයක් ඇති වී ඇති බවත්, එමගින් සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධා එල්ල වී ඇති බවත් අවධානයට ලක් වූ බැවින්, ඒ සඳහා සුදුසු විසඳුමක් ලබා දීමට කටයුතු කරන ලෙස කොමිෂන් සභාව විසින් කලාප අධ්‍යාපන කාර්යාලයට දැනුම් දී ඇත. අදාළ ගුරුවරයාගේ ස්ථාන මාරුව හේතුවෙන් සිසුන්ගේ පැමිණීම අඩාල වී ඇති බව පෙන්වා දීම සඳහා විදුහල්පතිවරිය විසින් පැමිණීමේ ලේඛන ඉදිරිපත් කර තිබේ. පෙබරවාරි සිට ජූලි දක්වා වූ එම වාර්තා පරීක්ෂා කිරීමේදී, ජුනි සහ ජූලි මාසවල සිසුන්ගේ පැමිණීමේ අඩුවක් දක්නට ලැබුණද, ඊට සමාන්තර පැමිණීමේ අඩුවීම් අනෙකුත් මාසවලදී ද නිරීක්ෂණය වේ.

- මනෝ විද්‍යාත්මක සේවා මධ්‍යස්ථානයේ උපදේශන මනෝරෝග චිකිත්සක සමිතා ඇතුල්දොරආරච්චිගේ 2025.05.18 දිනැති ලිපිය මගින් දැක්වෙන පරිදි, වින්දිත සිසුවිය 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටියදී බාලදක්ෂ සහ විනය භාර ආචාර්ය සුලාරි උමන්දා ජයවර්ධන මහත්මිය විසින් සිදු කරන ලද අඛණ්ඩ මානසික හා චිත්තවේගීය පීඩාවන් හේතුවෙන්, 2024 ජනවාරි 24 වන දින ඇයව ප්‍රථම වරට මනෝ උපදේශන සේවාව වෙත යොමු කර ඇත. දරුවා සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා, වෘත්තීය අන්තර්ක්‍රියා සහ මනෝවිද්‍යාත්මක ඇගයීම් මත පදනම්ව, වාර්තා වූ සිදුවීම් හා සෘජු සම්බන්ධතාවක් ඇති චිත්තවේගීය පීඩාවක් සිසුවිය තුළ පවතින බව හඳුනාගෙන තිබේ. අදාළ ගුරුවරියගේ අධීක්ෂණය යටතේ ලද අයහපත් අත්දැකීම් හේතුවෙන් සිසුවිය අඛණ්ඩ කාංසාව, බිය සහ ආත්ම අභිමානය හීන වීමේ හැඟීම් පළ කර ඇති බව එම ලිපියේ සඳහන් වේ. තවද, සුලාරි උමන්දා ජයවර්ධන මහත්මිය විසින් ඇති කරන ලද එම චිත්තවේගීය පීඩාවට අමතරව, පන්ති භාර ගුරු තුෂාන් මහතා විසින් සිදු කරන ලද ශාරීරික හිරිහැර ද සිසුවියගේ මානසික යහපැවැත්ම තවදුරටත් පිරිහීමට බලපා ඇති බව එම වාර්තාව මගින් පෙන්වා දී ඇති බව නිරීක්ෂණය වේ. මෙම සිදුවීම 2025.02.18 දින

සිදුව ඇති නමුත් දරුවා අධිකරණ වෛද්‍යවරයා වෙත දරුවා 2025.06.19 දින ඉදිරිපත්ව ඇති බව නිරීක්ෂණය වන අතර, අධිකරණ වෛද්‍යවාර්තාවේ දරුවාට ශාරීරික තුවාලයක් නොමැති බව සඳහන් කර ඇති නමුත් රිජ්වේ ආර්යා ළමා රෝහලේ මනෝවිකිත්සක විග්‍රහය අනුව, දරුවා පශ්චාත් කම්පන ආතති ආබාධය (PTSD) සහ අධික කාංසාව සහ අවපීඩන ලක්ෂණ වලට ලක්ව සිටින බවත්, වෛද්‍ය ප්‍රතිකාර යටතේ සිටින බවත් සනාථ වන බව නිරීක්ෂණය වේ.

- වින්දිත ශෙසනායා සිසුවිය බාලදක්ෂ, සංගීත සහ ශිෂ්‍ය නායක ඇතුළු විෂය සමගාමී ක්‍රියාකාරකම්වල සක්‍රීයව නිරත වූ සමාජශීලී දරුවෙකු බව විදුහල්පතිවරිය, බාලදක්ෂ ආචාර්යවරිය සහ පන්ති භාර ගුරුවරයාගේ ප්‍රකාශ මෙන්ම ඉදිරිපත් කර ඇති සාක්ෂි ලේඛන මගින් තහවුරු වේ. කෙසේ වෙතත්, පැමිණිල්ලේ සඳහන් පරිදි 2025.02.18 දින පන්ති භාර ගුරුවරයා විසින් පන්ති වාර්තා පොතකින් ඇයට පහර දී ඇති බව රිජ්වේ ආර්යා ළමා රෝහලේ මනෝවිකිත්සක වාර්තාව මගින් සනාථ වේ. එසේම, විදුහල්පතිවරිය විසින් සිද්ධියට අදාළව සිසුන්ගෙන් ලබාගෙන ඇති ප්‍රකාශ මගින් පන්ති භාර ගුරුවරයා පහර දීම් සිදු කරන බවත්, වින්දිත සිසුවියට පහර දී ඇති බවත් තහවුරු වන අතර, කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සිදු කළ පරීක්ෂණ කමිටු වාර්තාව මගින් ද එම කරුණ වැඩිදුරටත් සනාථ කර ඇති බව නිරීක්ෂණය වේ.

- පන්ති භාර ගුරුවරයා, අංශ භාර ගුරුවරයා සහ විදුහල්පතිවරිය විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ හා ලිඛිත කරුණු දැක්වීම්වලදී, මෙම සිදුවීම පහරදීමක් නොව පන්ති වාර්තා පොතෙන් සිදු කළ *'තට්ටු කිරීමක්'* පමණක් බව සඳහන් කරමින් සිද්ධිය ලඝු කොට දැක්වීමට උත්සාහ කර ඇති බව පෙනී යයි. එසේ වුවද, අදාළ සිදුවීම දරුවාට නැවත නැවතත් සිහිගැන්විය හැකි මට්ටමේ මානසික බලපෑමක් (Trauma) ඇති කර ඇති බව වෛද්‍ය සහ මනෝවිකිත්සක වාර්තා මගින් විද්‍යාත්මකව තහවුරු කර ඇති බව නිරීක්ෂණය වේ. පාසල් දරුවන්ට ශාරීරික දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් චක්‍රලේඛ මගින් පැහැදිලි උපදෙස් ලබා දී තිබියදීත්, විදුහල්පතිවරිය විසින් මෙම සිදුවීම පොතකින් සිදු කළ සුළු තට්ටු කිරීමක් ලෙස අර්ථකථනය කර තිබීමත්, ගුරුවරයාගේ එම හැසිරීම සාමාන්‍ය දඬුවම් ක්‍රමයක් බව බොහෝ දෙමාපියන් විසින් ද පිළිගෙන තිබීමත් නිරීක්ෂණය වේ.

- විදුහල්පතිවරිය විසින් සිසුන්ගෙන් ලබාගෙන ඇති ප්‍රකාශ මඟින්, පන්ති භාර ගුරුවරයා විසින් දඬුවම් කිරීම් සිදු කරන බව තහවුරු වී ඇතත්, විදුහල්පතිවරිය ඒ සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය වේ. සිසුන්ගේ ප්‍රකාශවල සඳහන් *"සර් අපිට ගහනවා, බනිනවා, ඒත් අපේ හොඳටයි, අපේ අම්මලත් කැමති , ගුරුවරයෙක්ගෙන් ගුටි කන්න බැරි තරම් මහන්තත්තකමක් අපේ වයස ළමයින්ට සුදුසු නෑ..., ගැහුවත් ඒක අපේ හොඳට කරන්නේ.., බනින, ගහන නිසා තමා අපි වැඩ කරන්නේත්.."* වැනි අදහස් මගින් පාසල තුළ ශාරීරික දඬුවම් සාමාන්‍යකරණය වූ උපසංස්කෘතියක් (Normalization of corporal punishment) පවතින බව මැනවින් පෙන්නුම් කරයි. පාසල් පරිපාලනය විසින් දඬුවම් මාර්ගයෙන් සිසුන් පාලනය කිරීම ඔවුන් යහමඟට ගැනීමක් ලෙසත්, ඊට විරුද්ධ වීමට සිසුන්ට හැකියාවක් නොමැති බවටත් මතයක් සිසුන් අතර නිර්මාණය වී ඇති බව ඔවුන්ගේ ප්‍රකාශවලින් පැහැදිලි වේ. එසේම, සිසුන් යම් වරදක් සිදු කර ඇත්නම් ඔවුන් සුළු දඬුවමකට යටත් කළ යුතු බව සඳහන් කරමින් දෙමාපියන් විසින් අත්සන් කරන ලද ලිපිය මගින් ද මෙම දඬුවම් ක්‍රමවේදය වක්‍රව අනුමත කර ඇති බව නිරීක්ෂණය වේ.

- අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016 දරන චක්‍රලේඛයේ 2.1 උප වගන්තිය මගින් පැහැදිලිව අවධාරණය කර ඇත්තේ, සිසුවෙකු තුළ යහපත් චර්යාමය වෙනසක් ඇති කිරීමේ අරමුණින්

සද්භාවයෙන් යුතුව වුවද, කිසිදු සිසුවෙකුට ශාරීරික පීඩනයක් ඇති විය හැකි ආකාරයේ දඬුවම් ලබා දීමෙන් වැළකී සිටීමට සියලු පාර්ශව වගබලා ගත යුතු බවයි.

- අදාළ සිදුවීමෙන් පසුව දරුවා නැවත පාසල වෙත පැමිණ ඇති බව නිරීක්ෂණය වුවද, එහිදී සම වයස් කණ්ඩායම් මගින් ඇයව හුදකලා කිරීම සහ බහිෂ්කරණයට ලක් කිරීම යන කරුණු හේතුවෙන් 2025.04.08 දින සිට ඇය පාසල් පැමිණීම ප්‍රතික්ෂේප කර ඇත. ඇය අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා සූදානම් වෙමින් සිටියද, සිද්ධිය හේතුවෙන් ඇති වූ දීර්ඝකාලීන මානසික බලපෑම මත ඇයගේ අධ්‍යාපන අයිතියට ද බාධා එල්ල වී ඇති බව නිරීක්ෂණය වේ.

- මෙම සිදුවීම සම්බන්ධයෙන් විදුහල්පතිවරිය දැනුවත් කිරීමෙන් අනතුරුව, අදාළ පන්ති භාර ගුරුවරයා ඉගැන්වීම් සිදු කරන කාල පරිච්ඡේද තුළ සිසුවියට උපදේශන කාමරයේ හෝ පුස්තකාලයේ රැඳී සිටින ලෙස උපදෙස් දීම, දරුවා පාසලෙන් ඉවත් කරගෙන යන ලෙස දෙමාපියන්ට දැන්වීම සහ දරුවාට පාසලෙන් අස්වී යන ලෙසට ප්‍රකාශ කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින් දරුවාගේ අධ්‍යාපන අයිතියට සෘජුවම හානි සිදු වී ඇති බව නිරීක්ෂණය වේ. විමර්ශන අවස්ථාවේදී විදුහල්පතිවරිය ප්‍රකාශ කර ඇත්තේ, දරුවාගේ මව එම පාසලේම ගුරුවරියක බැවින් ඇය විශේෂ වරප්‍රසාද අපේක්ෂා කරන බවත්, ඒවා අහිමි වීම හේතුවෙන් මෙලෙස පැමිණිලි කරන බවත් ය. තවද, ඇය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත ප්‍රකාශයේ *"රසිකා වීරමන් ගුරුතුමියගේ අදූරදර්ශී ක්‍රියාකලාපය"* ලෙසත්, *"පුරුද්දක් වශයෙන් ඉංග්‍රීසි පොත හා අනෙක් පොත් නිවසේ දමා ඒම දරුවාගේ අධ්‍යාපන සංවර්ධනයට බාධාවක් නිසා, ඇයගේ අනාගත අභිවෘද්ධියත්, විෂය සංවර්ධනයත් වෙනුවෙන් ඇයගේ පන්ති භාර ගුරුතුමා ලබාදුන් සුළු දඬුවම දඩමීමා කරගෙන"* යනුවෙන් සඳහන් කර තිබීම තුළින්, විදුහල්පතිවරිය මෙම සිදුවීම සම්බන්ධයෙන් අපක්ෂපාතීව සහ සහකම්පනයෙන් යුතුව කටයුතු කර නොමැති බවත්, අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියා කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

- වගඋත්තර විදුහල්පතිවරිය විසින් කලාප අධ්‍යාපන කාර්යාලය වෙත යොමු කරන ලද 2025.06.05 දිනැති ලිපිය මගින්, වින්දිත දැරියගේ මව වන රසිකා වීරමන් ගුරු මහත්මිය සම්බන්ධයෙන් කරුණු දක්වමින් ඇය වෙනත් පාසලකට ස්ථාන මාරු කරන ලෙස ඉල්ලීම් කර ඇති බව නිරීක්ෂණය වේ. වින්දිත දැරිය ගුරුවරියකගේ දරුවෙකු බැවින් විශේෂ වරප්‍රසාද අපේක්ෂා කරන බවත්, ඒවා නොලැබීම හේතුවෙන් ගුරුවරුන්ට චෝදනා එල්ල කරන බවත් අදාළ ලිපියෙහි සඳහන් කර ඇත. තවද, දැරිය මාස ගණනාවක් අඛණ්ඩව පාසල් නොපැමිණ, ගුරුවරුන් විසින් පහර දෙන බවට සහ බැන වදින බවට අසත්‍ය චෝදනා නගමින් පොලිසිය වෙත පැමිණිලි කර ඇති බවත්, මවගේ මෙම ක්‍රියාකලාපය හමුවේ ගුරුවරුන් පීඩාවට පත්වීම නිසා පාසලේ සෙසු දෙමාපියන් අතර නොසන්සුන්තාවයක් හටගෙන ඇති බවත් එහි වැඩිදුරටත් අවධාරණය කර තිබේ. කෙසේ වෙතත්, ඊට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) විසින් 2025.05.30 දිනැති ලිපිය මගින් විදුහල්පතිවරිය වෙත දන්වා තිබුණේ, කලාප කාර්යාලය වෙත ලැබී ඇති පැමිණිල්ලකට අනුව පරීක්ෂණයක් සිදුකරන තෙක් පන්තිභාර තුෂාන් නෙරංජන ගුරුවරයා කලාප කාර්යාලයට වාර්තා කරවන ලෙසයි. එවන් පසුබිමක් තුළ විදුහල්පතිවරිය 2025.06.05 දින ඉහත කරුණු ඇතුළත් ලිපිය කලාප කාර්යාලය වෙත යොමු කර ඇති බව පෙනී යයි. ඒ අනුව, කලාප කාර්යාලය මගින් සිදුකරන පරීක්ෂණය සඳහා අපක්ෂපාතීව සහය ලබා දෙනු වෙනුවට, වගඋත්තර විදුහල්පතිවරිය විසින් පැමිණිලි පාර්ශවයට එරෙහිව කරුණු වාර්තා කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

- වින්දිත සිසුවියට සහ එම පාසලේම ගුරුවරියක වන ඇයගේ මවට එරෙහිව පාසල් සිසුන් විසින් ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් සහ පත්‍රිකා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. පාසල් සිසුන්

විසින් භාවිතා නොකළ යුතු මට්ටමේ වචන එම පත්‍රිකාවල අන්තර්ගත වී ඇති බවත්, මෙම තත්ත්වය පාලනය කළ නොහැකි මට්ටමකට පත්ව ඇති බවත් විදුහල්පතිවරිය විසින්ම පිළිගෙන තිබේ. ඒ අනුව, මෙම ගැටලුව සම්බන්ධයෙන් සිසුන්ගේ විනය විරෝධී ක්‍රියාකලාපය පාලනය කර ගැනීමට විදුහල්පතිවරිය නිසි පියවර ගෙන නොමැති බවත්, මේ පිළිබඳව ඉහළ පරිපාලනය දැනුවත් කිරීමට කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

- විමර්ශන අවස්ථාවේදී අදහස් දක්වමින් වගඋත්තර විදුහල්පතිවරිය ප්‍රකාශ කර ඇත්තේ, තමා දරුවන්ට පාසල් ගුරුවරුන් ලබා දෙන දඬුවම් පිළිබඳව තමන් විමසීමට නොයන බවයි. එසේම, ගුරුවරුන් විසින් දරුවන් හැඳීමට මැදිහත් නොවී, ඉගැන්වීම් කටයුතු පමණක් සිදු කර පන්තියෙන් පිටවිය යුතු බවට ගුරුවරුන්ට උපදෙස් ලබා දී ඇති බව ද ඇය සඳහන් කර ඇත. තවද ඇයගේ ලිඛිත ප්‍රකාශයේ "සුළු දඬුවම දඩමීමා කරගනිමින්" යනුවෙන් සඳහන් කර තිබීම තුළින්ම, විදුහල්පතිවරියට අධ්‍යාපන අමාත්‍යාංශයේ 12/2016 චක්‍රලේඛයේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් නිසි අවබෝධයක් හෝ වගවීමක් නොමැති බව පැහැදිලි වේ. එවැනි පරිපාලන ව්‍යුහයක් තුළ ගුරුවරුන් නිසි පරිදි මෙහෙයවීමට ඇය අසමත් වී ඇති බවත්, උපදේශන ගුරුවරියගේ කරුණු දැක්වීම් මගින් දරුවාගේ මානසික තත්ත්වය පෙන්වා දී තිබියදීත්, ඒ පිළිබඳව සංවේදීව ක්‍රියා කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

- පාසල් පරිසරය සහ අනෙකුත් සිසුන්ගේ ප්‍රතිචාර සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී, අනෙකුත් සිසුන් විසින් වින්දිත දරුවා බහිෂ්කරණයට සහ අපහාසයට ලක් කර ඇති බව රිජ්වේ ආර්යා ළමා රෝහලේ සායනික වාර්තා හා අනෙකුත් ලිඛිත සාක්ෂි මගින් තහවුරු වේ. තවද, සිසුන් විසින් පාසල් භූමිය තුළ අපහාසාත්මක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සහ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රකාශ නිකුත් කිරීම හේතුවෙන්, දරුවාගේ මව ද අපහාසයට හා හිංසනයට පත්ව ඇති අතර, එමගින් ඇයගේ වෘත්තීය අභිමානයට ද හානි සිදු වී ඇති බව නිරීක්ෂණය වේ.

- මෙම සිදුවීමේදී පාසල් පරිපාලනය, ගුරු මණ්ඩලය, සිසුන් සහ සෙසු දෙමාපියන් යන පාසල් ප්‍රජාව විසින් වින්දිත සිසුවිය සහ ඇයගේ දෙමාපියන් පීඩාවට පත් කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, වින්දිත සිසුවිය හුදකලා කිරීම සහ සමාජ බහිෂ්කරණයට ලක් කිරීම තුළින්, ඇයගේ මානසික හා චිත්තවේගීය තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය සහකම්පනයෙන් යුත් හිතකර පරිසරයක් පාසල තුළ නොමැති බව පෙනී යයි. ඒ අනුව, දරුවාට සුදුසු වෙනත් පාසලක් ලබා දෙන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කලාප අධ්‍යාපන කාර්යාලයට කළ දැනුම්දීම මත, රත්නාවලී බාලිකා විද්‍යාලය, නාරාහේන්පිට සුජාතා බාලිකා විද්‍යාලය සහ ලින්ඩ්සේ බාලිකා විද්‍යාලය යන පාසල් ත්‍රිත්වයෙන් එකක් සඳහා දරුවා ඇතුළත් කළ හැකි බව දෙමාපියන් වෙත දැනුම් දී ඇත. එසේ වුවද, අංක බප/කො/කලාප/පාපා03/විනය/2025 හා 2025.10.02 දිනැති ලිපිය මගින් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වාර්තා කර ඇත්තේ, යෝජිත පාසල්වලට ඇතුළත් වීමට දරුවාගේ මව අකමැත්ත පළ කර ඇති බවයි. බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්වරයා වෙත යොමු කරන ලද 2025.09.22 දිනැති ලිපිය මගින් දෙමාපියන් පෙන්වා දී ඇත්තේ, යෝජිත පාසල් අතුරින් පාසල් දෙකක ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීමේ පහසුකම් පැවතියද, එම පාසල් දරුවා දැනට ඉගෙනුම ලබන පාසලට සාපේක්ෂව අඩු ශ්‍රේණිගත කිරීමක පවතින බැවින් දරුවා එම පාසල් වෙත යොමු කිරීමට කැමැත්තක් නොදක්වන බවයි. මේ අනුව, දරුවාගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීමට කලාප අධ්‍යාපන කාර්යාලය පියවර ගත්තද, දෙමාපියන් එම විකල්පවලට එකඟ නොවීම හේතුවෙන්, දරුවා යශෝධරා විද්‍යාලය හරහා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා අයදුම්පත් යොමු කර ඇති බව වාචිකව කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති බව නිරීක්ෂණය වේ.

- අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ අන්තර්ගත ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාවට අනුව, දරුවන්ගේ පෞරුෂයේ පරිපූර්ණ සංවර්ධනයට දායක වීම සෑම ගුරුවරයෙකුගේම වගකීමකි. එසේම, 'ස්ථානීය දෙමාපියන්' (In Loco Parentis) යන නෛතික සංකල්පයට අනුව සිසුන්ගේ සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීමට ගුරුවරුන් බැඳී සිටින බව එහි පැහැදිලිව දක්වා ඇත. කෙසේ වෙතත්, විදුහල්පතිවරිය විසින් ගුරුවරුන්ට උපදෙස් ලබා දී ඇත්තේ "දරුවන් හැදීමට උත්සාහ නොකරන ලෙසත්, ඉගැන්වීම් කටයුතු පමණක් සිදු කරන ලෙසත්" ය. විදුහල්පතිවරියගේ මෙම උපදෙස් සහ ක්‍රියාකලාපය හේතුවෙන්, උක්ත චක්‍රලේඛයේ 5.4, 6.3 සහ 6.8 වගන්තිවල සඳහන් පරිදි ගුරුවරයෙකු සතු නිර්මාණාත්මක මගපෙන්වන්නෙකු, උපදේශකයෙකු සහ දැනුම සම්ප්‍රේෂණය කරන්නෙකු ලෙස දරුවන්ගේ දැනුම, කුසලතා, යහපත් ආකල්ප හා සමාජ සාරධර්ම සංවර්ධනය කිරීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

- 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහ පනතේ 308 (අ) වගන්තිය ප්‍රකාරව "ළමයි කෲරත්වයට භාජනය කිරීම නීති විරෝධී වන අතර " 311 (ඇ) වගන්තිය අනුව " වයස අවු 18 අඩු සෑම කෙනෙකුම ළමයෙකු ලෙසත් ඔවුන් හට විශ්ව ළමා ප්‍රඥප්තියේ සඳහන් සියළු අයිතිවාසිකම් හිමිවිය යුතු බවත් විශ්ව ළමා අයිතිවාසිකම් සම්මුතියෙහි පළමු වන වගන්තියෙන් අවධාරණය කර ඇත. ඒ අනුව වින්දිත දැරිය අවුරුදු 15ක් වන බැවින් දරුවකු ලෙස උක්ත සියලු හිමිකම් වලට අයිතියක් ඇති බව නිරීක්ෂණය වේ.

- ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ස්ථිර කර ඇති 1989 ළමා අයිතිවාසිකම් පිළිබද සම්මුතියේ 28(2) වගන්තිය මගින් පාසල තුළ විනය පාලනය සිදු කිරීමේදී ළමයාගේ මානව ගරුත්වයට අනුකූලව එය සිදු කළ යුතු බවට අවධාරණය කර ඇත. මේ බව අංක 12/2016 දරන චක්‍රලේඛයේ 2.2 උප වගන්තිය තුළින්ද පිළිගනු ලබයි. මේ අනුව  ළමයින්ට එරෙහිව කිසිදු ආකාරයක ශාරීරික හෝ මානසික හිංසනයක් වළක්වා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබද සම්මුතිය මගින් පනවන ලද ප්‍රමිතීන්ගෙන් බැහැර වීමට කිසිදු ව්‍යතිරේකයකට ඉඩ නොදෙන අතර ඒ බව එම ප්‍රඥප්තියේ 19 වන ව්‍යවස්ථාව තුළින් තහවුරු කර ඇති පසුබිමක වගඋත්තරකරුවන් දරුවාට මානසික වධහිංසාවක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

- <u>හේවා මද්දුමගේ කරුණාපාල ඒ. ජයන්ත ප්‍රේම කුමාර සිරිවර්ධන **[SC FR /97/2017]**</u> තීරණයේදී පාසල් විනය භාර ගුරුතුමා විසින් ශිෂ්‍යයෙකුගේ වම් කනට සිදු කළ පහරදීමක් හේතුවෙන් ශිෂ්‍යයාගේ වම් කනෙහි ඇසීම ස්ථිරවම අහිමි වීම තුළින් වින්දිතයාට සිදු වූ ශාරීරික මානසික හානිය නීති විරෝධී ක්‍රියාවක් ලෙස අර්ථ කථනය කරමින් ප්‍රශ්නගත ගුරුතුමාගේ ක්‍රියාව 11 වන ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙසත්, ශාරීරික දඬුවම් විනය ක්‍රියාමාර්ගයක් ලෙස ගත නොහැකි බවත්, එවැනි විනය පරිචයන් මුලිනුපුටා දැමීම රජයේ වගකීමක් බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත. ඒ අනුව දරුවකුට සිදුවන ශාරීරික මෙන්ම මානසික හානිය ද නීතිය යටතේ සලකා බැලිය යුතු නීතිවිරෝධී ක්‍රියාවක් බව තහවුරු කර ඇත.

- <u>සිල්වා එදිරිව සභාපති, පොහොර සංස්ථාව **(1989) 2 SLR 393**</u> නඩුවේ දී විනිසුරු 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කරන ලද සැලකිල්ල හුදෙක් ශාරීරික ප්‍රචණ්ඩත්වට සීමා නොවිය , එමඟින් ආත්මය සහ මතය සහ විෂය පථයද අදාළ කරගනියි ලෙස  තීරණය කර ඇත.

- <u>විජේසිංහ චූලංගනී එරෙහිව වරුණී බෝගහවත්ත **(SC FR App No. 677/2012 හි 2019 ජුනි 12 ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්)**</u> නඩුවේදී අධිකරණය විසින් වැදගත් නිරීක්ෂණයක් සිදු කර ඇත.

එනම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ කුරිරු, අමානුෂික සහ අවමන් සහගත සැලකීමක් පිළිබඳ නිගමනයකට එළැඹීම සඳහා ඉහළ මට්ටමේ නිශ්චිතභාවයකට අමතරව, ඉතා බරපතල මට්ටමේ හිංසනයක් (High degree of maltreatment) ද පැවතිය යුතු බව ස්ථාපිත නීතිය වුවද;"...වැඩිහිටියෙකුට අදාළ වන 'බරපතල මට්ටමේ හිංසනය' පිළිබඳ නිර්ණායකය සෑම විටම බාලවයස්කරුවෙකුගේ මානසික තත්ත්වය (Mental constitution) හා සමපාත නොවේ. එබැවින්, බාලවයස්කරුවෙකු විසින් අවමන් සහගත සැලකීම් පිළිබඳව පැමිණිලි කරන අවස්ථාවක, 'ඉහළ භාරකරු' (Upper Guardian) ලෙස කටයුතු කරන අධිකරණය, අදාළ ක්‍රියාව ඉහත කී 'බරපතල හිංසන මට්ටම' සපුරා නොමැති බව පවසමින් එම පැමිණිලි ප්‍රතික්ෂේප කිරීමට හදිසි නොවිය යුතුය. ඒ වෙනුවට, චෝදනා එල්ල වී ඇති ක්‍රියාව මඟින් අදාළ දරුවාගේ මානසිකත්වයට සහ වර්ධනයට සිදු වී ඇති බලපෑම පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුය." යනුවෙන් දක්වා ඇත. ඉහත නඩු තීන්දුවේ සඳහන් නීතිමය තත්ත්වයන්ට අනුව, මෙම සිදුවීමේදී ද වින්දිත දැරියට සිදුව ඇති මානසික වදහිංසාව, කුරිරු, අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලක් ලෙස සැලකිය හැකි බව නිරීක්ෂණය වේ.

**නිගමනය**

ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ පාර්ශවකරුවකු වන පසුබිමක ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රජයට නෛතික බැඳීමක් සහ වගකීමක් පවතී. එසේම, අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016 සහ 2012/37 දරන චක්‍රලේඛ මඟින් මේ සම්බන්ධයෙන් පැහැදිලි උපදෙස් ලබා දී තිබියදීත්, 2025.02.18 දින පළමු වන වගඋත්තර පන්ති භාර ගුරු තුෂාන් නෙරංජන මහතා විසින් වින්දිත සිසුවියට පන්ති වාර්තා පොතකින් පහර දී ඇති බව තහවුරු වේ. මෙම ක්‍රියාව "සුළු තට්ටුවක්" පමණක් බව වගඋත්තරකරු, විදුහල්පතිවරිය සහ අංශ භාර ගුරුවරයා විසින් හුවා දැක්වීමට උත්සාහ කළද, එමගින් දරුවාගේ මානසික සෞඛ්‍යයට දැඩි හානියක් සිදු වී ඇති බව වෛද්‍ය සහ මනෝවිකිත්සක සාක්ෂි මගින් විද්‍යාත්මකව තහවුරු වේ. පන්ති කාමරයට පොත රැගෙන නොපැමිණීම හේතුවෙන් ගුරුවරයා විසින් පොතකින් පහර දුන් බවට සිසුන්ගේ ප්‍රකාශ, වින්දිත දැරිය උපදේශන හා මනෝවිකිත්සකවරයා වෙත ලබා දී ඇති ප්‍රකාශ සහ කලාප අධ්‍යාපන කාර්යාලයේ පරීක්ෂණ වාර්තා මගින් තහවුරු වී ඇත. යම් ක්‍රියාවක් වධහිංසාවක් ලෙස සැලකීම සඳහා අවශ්‍ය වන මූලිකාංග වන දැඩි මානසික පීඩාවක් ඇති කිරීම, දඬුවම් කිරීමේ චේතනාව සහ නිල බලය යොදා ගැනීම යන කරුණු මෙහිදී සම්පූර්ණ වී ඇති බැවින්, පළමු වන වගඋත්තර තුෂාන් නෙරංජන මහතා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමු.

දෙවන වගඋත්තර බාලදක්ෂ භාර ආචාර්ය සුලාරි උමන්දා ජයවර්ධන මහත්මිය විසින් පාසල තුළදී වින්දිත දැරිය දීර්ඝකාලීනව මානසික හා චිත්තවේගීය හිංසනයට ලක් කර ඇති බවට චෝදනා එල්ල වී ඇත. කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සිදු කරන ලද පරීක්ෂණයේදී සිසුන් ලබා දී ඇති ප්‍රකාශවලට අනුව ඇය අනෙක් සිසුන්ට ද බැණ වදින බව නිරීක්ෂණය වුවද, ඇය විසින් වින්දිත දැරිය ඉලක්ක කර ගනිමින් මානසික හිංසනයක් සිදු කර ඇති බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී නොමැති බව නිගමනය කරමු.

මෙම සිදුවීමේදී පාසල තුළ 'ස්ථානීය දෙමාපියන්' (In Loco Parentis) ලෙස කටයුතු කිරීමට බැඳී සිටින තෙවන වගඋත්තර විදුහල්පතිවරිය, ස්වකීය වගකීම් පැහැර හරිමින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. විමර්ශන අවස්ථාවේදී ඇය විසින් සිදු කරන ලද ප්‍රකාශ වන *"ගුරුවරුන්ට දරුවන් හැඳීමට නොයන ලෙසත්, ඉගැන්වීම් කටයුතු පමණක් සිදු කර පන්තියෙන් පිටවන ලෙසත් උපදෙස් ලබා දී ඇති බව"* සහ *"ගුරුවරයා පහර දෙන බවට සිසුන්ගේ ප්‍රකාශවලින් අනාවරණය නොවූ බැවින් කලාප නිලධාරීන් දැනුවත් නොකළ බව"* යන කරුණු තුළින් ඇයගේ සිසුන් සම්බන්දයෙන් දක්වන දුර්වල ආකල්පය පිළිබිඹු වේ. එක් සිසුවෙකු ප්‍රකාශයක් කළ පමණින් ගුරුවරයෙකු මාරු කළ

නොහැකි බවත්, වින්දිත දැරියගේ මව "අදූරදර්ශී ක්‍රියාවක්" සිදු කර ඇති බවත් පවසමින් ඇය පක්ෂග්‍රාහීව කටයුතු කර ඇත. ගැටලුව ඉදිරිපත් කිරීමෙන් පසු දරුවා පාසලෙන් ඉවත් කර ගැනීමට උපදෙස් දීම, අදාළ ගුරුවරයාගේ කාල පරිච්ඡේදවලදී දරුවා පුස්තකාලයේ හෝ උපදේශන කාමරයේ රඳවා තැබීමට විසඳුම් ලබා දීම සහ පන්ති භාර ගුරුවරයා පහර දීම් සිදු කරන බවට සිසුන්ගේ ප්‍රකාශ තිබියදීත් ඒ පිළිබඳ අවධානය යොමු නොකිරීම බරපතල පරිපාලන දුර්වලතාවකි. එසේම, වින්දිත දැරියගේ මව විශේෂ වරප්‍රසාද අපේක්ෂා කරන බවට චෝදනා කිරීම සහ පාසලේ සිසුන්ගේ විනය පිරිහීම පාලනය කළ නොහැකි බව පවසමින් වගකීමෙන් බැහැර වීම තුළින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ 12/2016 සහ 2012/37 චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විදුහල්පතිවරිය අපොහොසත් වී ඇත. මෙම ක්‍රියාකලාපය හේතුවෙන් පාසල් පරිසරය තුළ ගුරු සිසු අසමගිය වර්ධනය වී, වින්දිත දරුවාගේ අධ්‍යාපන අයිතිය, ආත්ම අභිමානය සහ මනෝ සමාජීය යහපැවැත්ම උල්ලංඝනය වී ඇති බැවින්, තෙවන වගඋත්තර විදුහල්පති නිලූකා සමන්කුමාරි මහත්මිය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමු.

සිව්වන වගඋත්තර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා නිර්දේශ ක්‍රියාත්මක කර ඇති අතර, පළමු වගඋත්තර ගුරුවරයාට ස්ථාන මාරුවීම් ලබා දීම සහ වින්දිත දරුවාගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සඳහා සුදුසු පාසල් නම් කිරීම සිදුකිරීම අනුව, තම රාජකාරිමය වගකීම ඉටුකර ඇතිබන පෙනීයන බැවින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සිදු කර නොමැති බව නිගමනය කරමු.

උක්ත කරුණු සලකා බැලීමේදී පළමු වන වගඋත්තරකරු විසින් වින්දිත පාර්ශවය සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ ද, තෙවන වගඋත්තරකාරිය විසින් වින්දිත පාර්ශවය සම්බන්ධව 12 වන වගන්තිය යටතේ ද තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමු.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

01. පළමු වගඋත්තරකරුගේ ඉහත ක්‍රියාකලාපය සම්බන්ධව, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විධිමත් විමර්ශනයක් පවත්වා ඊට අදාළව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

02. මෙම සිදුවීමේදී තෙවන වගඋත්තර විදුහල්පති නිලූකා සමන්කුමාරි මහත්මිය විසින් වින්දිත පාර්ශවය කෙරෙහි වූ අනුගමනය කරන ලද අසංවේදී සහ පක්ෂග්‍රාහී ක්‍රියාකලාපය, මෙවැනි සංවේදී ගැටලු පාසල තුළ ඇතිවන අවස්ථාවල දී එම අර්බුද කළමනාකරණය කිරීමට අවශ්‍යවන්නා වූ විදුහල්පති භූමිකාවට, මෙම විදුහල්පතිවරිය කොතෙක් දුරට සමීපවේ ද යන්න ගැටලු සහගතය. පාසල තුළ මානව හිමිකම් සහ ළමා අයිතිවාසිකම් සුරකෙන පරිසරයක් පවත්වාගෙන යාමට වත්මන් විදුහල්පතිවරිය අපොහොසත් වී ඇති බව ද නිරීක්ෂණය වේ.

එබැවින්, විදුහල්පතිවරියගේ පරිපාලනමය දුර්වලතා සහ චක්‍රලේඛ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විධිමත් විමර්ශනයක් කර, ඒ සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතුය.

03. යශෝධරා විද්‍යාලය තුළ පවතින "ශාරීරික දඬුවම් සාමාන්‍යකරණය කිරීමේ ක්‍රියාපිළිවෙල" (Normalization of Corporal Punishment) ඉවත් කිරීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාලය සහ අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් වී කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

2026. 02 . 26 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - අවශ්‍ය පියවර ගැනීම සඳහා